

# කුරුසියක් නොම වී මිදීමක් වූ එතුමා

විශේෂ
පාස්කු ප්‍රකාශනය

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මෙහෙවරකි

වර්ෂ 2026 ක් වූ අප්‍රේල් මස 03 වෙනි සිකුරාදා





**අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා**
**රදගුරු හිමිපාණෝ**

වයඹ පළාත් - කුරුණෑගල කතෝලික රදගුරු ප්‍රසාදීන් වහන්සේ
සභාපති, ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය.

2026 පාස්කු උදාව උත්ථානයේ විජයග්‍රහණය අත්දකින්න, සකල මිනිස් වර්ගයාට විවෘත ආරාධනයක් කරනු ලබන්නට සිත් වනුයේ, නැවුම් ආකල්ප සමූහයකින් සැබෑ ජීවිත පරිවර්තනයක් තුළින් මේ මුළු මිහිතලය ම අලුත් කරන්නට මෙවර පාස්කුව පිටුවහලක් කර ගනිමුයි යන අවශ්‍යතාවය සමඟින්ය.

"ක්‍රිස්තුන් වහන්සේ උත්ථාන කරනු නොලැබූ සේක් නම්, අපගේ දේශනා කිරීම නිරර්ථකය. ඔබගේ ඇදහීමත් නිරර්ථකය." (1 කොරෙන්ති 15:14)

ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය සිදු නොවුනා නම් කිතුනු දහම උපන් ගෙයිම මිය යන්නට ඉඩ තිබුණි.පාස්කු ඉරිදා අහෝසි වන්නට තිබිණි. ක්‍රිස්තුන් වහන්සේ ව අද බොහෝ දෙනෙකුට අමතක වන්නට තිබුණි.

ජේසුස් වහන්සේගේ උත්ථානය, උන්වහන්සේ මෙලොව සිටිය දී කල කී හැම දෙයක්ම සත්‍යවාදී බව සනාත කිරීමකි. දෙවියන් වහන්සේ උන්වහන්සේ ව උත්ථාන කිරීම, අසාධාරණ ලෙස මරණයට පත් කරන ලද සාමාන්‍ය නිර්දෝෂී මිනිසකු මරණයෙන් උත්ථාන කිරීමක් මෙන් නොවේ. මෙය ඊට සම්පූර්ණයෙන් ම පටහැනිය. ජේසුස් වහන්සේ ජීවත් වූ ආකාරය, උන්වහන්සේ ගේ මෙම මහිමාන්විත විජයග්‍රහණයට හේතු විය. උන්වහන්සේගේ බැහැපත් කම, කීකරුකම හා පියාණන් වහන්සේ වෙත තිබූ ප්‍රේමය මල්ඵල ගැන් වූ අවස්ථාව උත්ථානයයි. උන්වහන්සේගේ උත්ථානය අපෝස්තුළුවරුන්ගේ දේශනයේ මූලික හරය විය. කිතුනු විශ්වාසයේ කේන්ද්‍රස්ථානය උන්වහන්සේගේ උත්ථානය බව වඩාත් පැහැදිලි වූයේ ශුද්ධාත්ම ආගමනයෙන් පසුවය. (ක්‍රියා 2:22-25) අපෝස්තුළුවරුන්ගේ දේශනවල සම්පිණ්ඩනය වූයේ කුරුසියේ ඇණ ගසා මරණ ලද සමිදාණන් වහන්සේ දෙවියන් වහන්සේ උත්ථාන කල වගයි (ක්‍රියා 2:32) ඉහත සඳහන් කල සෑම සාධකයකින්ම අපට පෙනී යන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ මාංශගතවීමෙන් හා කුරුසියේ යාගයෙන් ආරම්භ කල ගැලවීමේ කෘත්‍ය උත්ථානයෙන් සම්පූර්ණ වූ බවයි. තවද, උන්වහන්සේ ගේ උත්ථානය මගින් කුරුසියේ ඇණ ගැසූ ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ විසින්ම ස්වාමියාණන් බවටත්, ක්‍රිස්තුස් වහන්සේ, දෙවියන් වහන්සේ විසින් ම ස්වාමියාණන් බවටත්, ක්‍රිස්තුන් වහන්සේ බවටත් පත් කල සේක.(ක්‍රියා 2:36)

එසේ නම් මරණය, සමාජ සාධාරණත්වය, හා මානව විමුක්තිය පිළිබඳ අරගලයෙන් වෙන් නොකල හැකි කොටසකි. එය ශාරීරික මරණය විය හැකි අතර, තම තත්ත්වයට හා ගෞරවයට, ධනයට හා බලයට මරණයට විය හැක.සම්පූර්ණ මානව විමුක්තිය උදෙසා උන්වහන්සේ අනුගමනය කිරීමට ඉදිරිපත් වන අය බොහෝ දුක් ගැහැට විඳීමට අවසානය දක්වා සූදානම් විය යුතු බව උන්වහන්සේ ඉගැන් වූ සේක. ජේසුස් වහන්සේ ව පාවාදීමෙන් පසු මරණය දක්වා ස්ව කැමැත්තෙන් ගමන් කරන අයුරු ශුද්ධ සුවිශේෂය පෙන්වා දෙයි.

වර්තමානයේ ඇතැම් ජනතා අභිලාෂයන් සහ කලකට පෙර පැතූ සිහින දියාරු වෙන යුගයක අප ජීවත් වන්නේ ද යන ගැටළුව හමුවේ නතර වී ඇති අපි, එතෙර වන්නට මාන බලන අවධියකි. අපේම නායකයින් අප වෙනුවෙන් යමක් ඉටු කරාවි යන අපේක්ෂා භංගත්වයට පත් උනාදෝ යන්න ඉස්මතු වී ඇති බව පෙනේ. පාස්කු ඉරුදින මිලේච්ඡ ප්‍රහාරයට වසර 07ක් ගතවන මේ මොහොතේ වින්දිතයන්ට සාධාරණයක් ඉටු නොවීම ගැන සභාව මහත් කනස්සල්ලෙන් පසුවන බව නොවලහා පැවසිය යුතුව ඇත.විවිධ පරිවර්තන, සංස්කරණ, ව්‍යාපෘති දියත් කර පූර්ණ සංවර්ධනයකට හිමිකම් කියන පුරවැසියන් නිර්මාණය කිරීම දුෂ්කර කාර්යයකි. එහෙත් යහපත් දෙයකට, යහපත් අරමුණින් කරනු ලබන උත්සහයන් අත්හළ නොහැකි බවද මතක තබා ගත යුතුය.

උත්ථාන වූ කිතු සමිඳුන් හමුවීමේ අත්දැකීමේ අපට නම් දෛනික ජීවිත අරගල, අනපේක්ෂිත සිද්ධීන් හමුවේ අපි ඉච්ඡාභංගත්වයට පත්වන්නෙමු. එබැවින් දේව වචනයතුළ ජීවත් වෙමු. සැබෑ පාස්කුවට ඇතුළු වෙමු.

ඔබ සැමට සුභ පාස්කු මංගලයක් වේවා!



**ගරු. ජූඩ් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු පියතුමා**

ජාතික කතෝලික ජනසන්නිවේදන අධ්‍යක්ෂ

උත්ථානවූ කිතු සමිඳුන් අපට දුන් උතුම්ම ත්‍යාගය "ශාලොම් "යන්නයි. එනම් සාමයයි. ඒ සාමය වනාහි අපි එදිනෙදා කථා කරන සාමය නොවෙයි. එය පූර්ණ සාමයක් වන අතර එය අපගේ ආත්මය හා බැඳී පවතින ඇතුළාන්ත සාමයයි. එය අපට ලබා ගත හැක්කේ මේ සියල්ල ලඟා කරගත් විටයි.

1. දෙවියන් වහන්සේ හා මා අතර පවතින සංහිඳියාව
2. මම සහ මා වටා සිටින අන් අය සමඟ පවතින සංහිඳියාව
3. මම සහ ස්වභාව ධර්මය සමඟ පවතින සංහිඳියාව
4. මම සහ මගේ අධ්‍යාත්මය සමඟ බැඳී පවතින සංහිඳියාව

මට මේ අංශ හතර සමඟ හොඳ සම්බන්ධතාවයක් හා ඒකාග්‍රතාවයක් ඇත්නම් මම මගේ ඇතුළාන්තයෙන් සාමය අත්විඳින කෙනෙකි. එය මට ලැබෙන්නේ බාහිරෙන් නොව එය මා තුළට ජනිත වී මගෙන් අන් අයට නිකුත් වන සාමය හා සමගියයි. උදාහරණයක් ලෙස මම, දෙවියන් සමඟ,මා සමඟ සහ අන් අය සමඟ ගැඹුරු සහ සම්බන්ධතාවයක් ඇත්නම් මගේ ඇතුළාන්තය ඉතා නිශ්චලය. මගේ සිත කැළඹී නැත. මා කිසිවෙකුට බිය නැත. මා ද කිසිවෙකුට වෛර නොකරයි. අන් අය මට අවැඩක් කළත් මම අන් අයට වෛර නොකරයි. ඒ මන්දයත් බාහිර කිසියම් කෙනෙකු මට බලපෑම් කළද ඉන් මගේ ඇතුළාන්ත ශාන්තිය බිඳින්නට නොහැකිය. මගේ ඇතුළාන්ත ශාන්තිය,සාමය රදා ඇත්තේ මම සහ දෙවියන් වහන්සේ අතර පමණී. අන් අය මට පීඩා කළද මගෙන් ඔවුනට නිකුත් වන්නේ ප්‍රේමයයි. ඒ මන්දයත් ඔවුන්ගේ පීඩාවන්ගෙන් මට කිසි අවැඩක් සිදුනොවන බව මම වටහාගෙන අවසන්ය. මම අන් අයට වෛර කිරීම තුලින් පීඩා විඳින්නේ මමම බව මම වටහාගෙන අවසන්ය. අන් අයගේ නපුරු ගති නිසා මගේ යහපත් ගති පාවාදීමෙන් අඩුවක් වන්නේ මටම බව මා වටහාගෙන අවසන්ය. එම නිසා අවසානයේ තව දුරටත් ඔවුන් මට පීඩා කරන්නේ නැත.

එම නිසා මේ වටිනා ත්‍යාගය, එනම් "ශාලොම්"නැමති සාමය උත්ථාන වූ කිතු සමිඳුන්ගෙන් ලබා ගන්නට අපි වෙර දරමු. උත්ථානවූ කිතු සමිඳුන්පළමු වරට තම ගෝලයින්ට දර්ශනය වූ මොහොතේ ඔවුන්ට දුන්නේ ඒ සාමයයි. එය අපටද ලබා ගත හැකි වන්නේ ක්‍රිස්තුන් වහන්සේ ජීවත්ව සිටින කළ ක්‍රියාවට නැන්වූ මේ දේවල් මගේ ජීවිතයේද ක්‍රියාත්මක කළ විටය. එනම්

1. දෙවියන්ට ප්‍රේම කිරීමත් උන්වහන්සේට මුළුමනින් අවනත වීම.
2. මම මට ප්‍රේම කරන්නාක් මෙන් අසල්වැසියාටත් ප්‍රේම කිරීම.
3. මම මගේ හෘද සාක්ෂියට අවනතවී ක්‍රියා කිරීම.
4. මම ස්වභාව ධර්මය සමඟ සංහිඳියාවකින් ජීවත් වීම.

මේ සාමය මා ලඟා කරගත් විට කිසිම බාහිර පුද්ගලයෙකුට එයට බාධා කළ නොහැක. මගෙන් එය උදුරා ගත නොහැක. ඒ සාමය මා තුළ පවතිනතාක් කල් මම පූර්ණ ප්‍රීතියෙන් ජීවත් වන කෙනෙක් වන්නේය.



**සුජිතාර් සිවනායගම් දේව ගැතිතුමා**
මහලේකම්
ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

### තුවාල වුණු දේශයක පාස්කුව

"ජීවමාන තැනැන්වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද? උන්වහන්සේ මෙහි නැත, උන් වහන්සේ උත්ථාන වූ සේක" (ලූක් 24:5-6)

අද පාස්කු උත්සවය අප වෙත පැමිණෙන්නේ සුවපහසු සැමරුමක් ලෙස නොව, අපව කළඹන්නාවූ ප්‍රශ්නයක් ලෙසය. අපගේ වේදනාව, ව්‍යාකූලත්වය සහ වෙහෙස මධ්‍යයේ එය අපට මුණගැසේ. ශ්‍රී ලංකාව යනු අන්ධකාරය හරහා ගමන් කිරීම යන්නෙහි තේරුම දන්නා දේශයකි. ආර්ථික බිඳවැටීම, දරාගත නොහැකි ණය, ඉහළ යන දරිද්‍රතාවය, තරුණයින්ගේ සංක්‍රමණය, විශ්වාසය බිඳවැටීම සහ බලාපොරොත්තු හීන වීම අපගේ ජනතාවගේ සාමාන්‍ය ජීවිත රටාවන් කෙරෙහි ගැඹුරින් බලපා ඇත. බොහෝ පවුල් කාංසාවෙන් හා අවිනිශ්චිතතාවයෙන් සිරවී ජීවත් වෙති.

මෙවැනි සන්දර්භයක් තුළ, පාස්කු උත්සවය චාරිත්‍රයකට, පූජාවකට හෝ තනි ප්‍රීතිමත් උද්‍යෝෂනකට සීමා කළ නොහැක. පාස්කු උත්සවය විරෝධතාවය පළ කිරීමක් විය යුතුය. මරණයට හා එහි සියලු ආකාරයන්ට එරෙහි විරෝධතාවය පළ කිරීමකි.

යේසුස් වහන්සේගේ උත්ථානය හුදෙක් මරණයෙන් පසු ජීවිතය ගැන නොවේ. එය බලාපොරොත්තු සුන්වීමෙන් පසු ජීවිතය, බිඳවැටීමෙන් පසු බලාපොරොත්තුව සහ වහල්භාවයෙන් පසු නිදහස ගැනය. සොහොනෙන් ඉවතට පෙරළා දැමූ ගල ඓතිහාසික සිදුවීමක් පමණක් නොවේ: එය අදටත් මානව ගරුත්වය අවහිර කරන සෑම ගලකම සංකේතයකි - ආත්මාර්ථකාමී පද්ධති, අසාධාරණ ආර්ථිකයන්, දේශපාලන අහංකාරය, ආගමික නිශ්ශබ්දතාවය සහ ජාතීන් වහල්භාවයට පත් කරන ගෝලීය ණය ව්‍යුහයන් ආදිය.

#### උත්ථානය අන්ධකාරයෙන් පිටතට පැමිණීමක් ලෙස

"ආලෝකය අන්ධකාරයෙහි බබළයි; අන්ධකාරය කිසි කලෙක එය ග්‍රහණය නොකෙළේය" (යොහන් 1:5)

අද අන්ධකාරය යනු අධ්‍යාත්මික කාරණයක් පමණක් නොවේ. එය ආර්ථික, සමාජීය සහ මානසික ය. දෙමව්පියන්ට තම දරුවන්ට ප්‍රමාණවත් ලෙස පෝෂණය කළ නොහැකි විට, තරුණයින්ට ඔවුන්ගේ අනාගතය පිළිබඳ විශ්වාසය නැති වූ විට, සේවකයින්ට අඩු වැටුප් ගෙවන විට සහ අධික ලෙස වැඩ කරන විට, ප්‍රජාවන් වාර්ගික, ආගම හෝ පන්තිය අනුව බෙදී ගිය විට - මෙය අන්ධකාරයයි. පාස්කු ඉරිදා ප්‍රකාශ කරන්නේ අන්ධකාරය අවසානය නොවන බවයි.

නැවත නැගිටීම යනු සියලු ආකාරයේ වහල්භාවයෙන් මිදීමේ අත්දැකීමයි - නින්දාවට පත් කරන දුප්පත්කම, වහල්භාවයට පත් කරන ණය, හුදකලා කරන ආත්මාර්ථකාමීත්වය සහ දුර්වලයන් තලා දමන පද්ධතීන්. යේසුස් වහන්සේ තනිවම නැගිටින්නේ නැත: උන්වහන්සේ අයුක්තියේ තුවාල උසුලාගෙන, කැළැල් සහිතව නැගිටිනු ලබයි. අතහැර දමා ඇති බවත්, නොඇසූ බවත් හැඟෙන සෑම ශ්‍රී ලාංකිකයෙකු සමඟම උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ සහයෝගීතාවයෙන් සිටියි.

16 පිටුවට >>>



**ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි**
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය

කිතුනු දින දර්ශනයේ අළු බදාදා දින සිට පාස්කු ඉරිදා දින තෙක් වන දින හතළිහක කාල සීමාව, "චතාරික සමය" ලෙස සැලකේ. එසමයෙහි තමා සිදු කළ පව් පිළිබඳ පශ්චාත්ථාපී ව, දෙවියන් වහන්සේ වෙත අචල භක්තියෙන් යාඥා කරමින් උපවාසයෙන් ගතකිරීමට කිතුනුවෝ උත්සුක වෙති. තමා පිළිබඳ නැවත හැරී බැලීමක් මින් සනිටුහන් වන අතර, එය නව ජීවිතයක ආරම්භයක් මෙනි. අප, අප දෙස හැරී බැලීම තරම් "අනාගත අප ව සකසා ගත හැකි" අන් මඟක් නැත. පසුතැවිලි වීම හරහා අපට, නිවැරදි විය හැකි ය. නිරාහාර ව සිටීම, දානයට අවශ්‍ය පසුබිම සකසයි. එය ශරීර සුවතාවට අමතර ව කුසගින්න පිළිබඳ අවබෝධය ලබා දෙයි. සහකම්පනය පැන නගින්නේ එතැනිනි.

මනස්ථාපයෙන් අළු තවරා ගැනීමෙන් ඇරඹෙන "චතාරික සමය" තුළ ක්‍රිස්තුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය මරණය හා උත්ථානය පිළිබඳ ව සිහිපත් කරනු ලබයි. අප සියලු දෙනාගේ පාපයන් වෙනුවෙන් වන්දි ගෙවූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අප වෙත ලබා දුන් දිව්‍යමය දායාදය වන දේව වචන හා ප්‍රේමය පිළිබඳ අදහස වෙත ළං වීමට කිතුනුවෝ මෙම සමය අවස්ථාවක් කොටගනිති. ලෝකයට යහපත ම දේශනා කළ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ, පාවා දෙනු ලැබීමෙන් අනතුරු ව, උන්වහන්සේ කුරුසි පත් කිරීමට තීන්දු තීරණ ගැනිණි. මේ අනුව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුසියත් කර තබාගෙන තෙවරක් ඇද වැටෙමින් කල්වාරිය වෙත ගිය ගමන, සියලු මිනිසුන්ගේ පාපය වෙනුවෙන් උන්වහන්සේ ව කුරුසිපත් කිරීම හා පාස්කු ඉරු දින උන්වහන්සේ නැවත උත්ථානය වීම මෙසේ සමරමින් සකල ලෝකවාසී කිතුනු ජනතාව පාස්කු මංගල්‍යය පවත්වනු ලබයි.

ලෝකාන්ධකාරය හා නපුර දුරු කොට, යහපත පිළිබඳ අපේක්ෂාව හා බලාපොරොත්තුව ගෙන එමින් සිදු වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය නමැති උන්වහන්සේගේ බලය ප්‍රකාශ වන මහා ප්‍රාතිහාර්ය සමරන මේ දිනය, අපට ද අපේ ජීවිතාන්ධකාරය පළවා හැරීමට ඇරයුම් කරයි. ප්‍රේමය ම තමාගේ ආගම කරගත් සහෝදර කිතුනු ජනතාව, මේ දිනය සකල ලෝකවාසී සත්වයන්ට ම ප්‍රේමය පැතිර වීමේ දිනය බවට පත් කර ගනිති. මෙය අපේක්ෂාවේ දිනයකි; ඉතා අඳුරු කාල පරිච්ඡේද ගත කරන විට පවා, සිතට දිරි සවි ලබා දෙන දිනයකි; සතුට පවතින දිනයකි. ඊට ඉත සිතින් සුබ පතමු.

එමෙන් ම 2019 අප්‍රේල් 21 දින සිදු වූ කටුවාපිටිය දේවස්ථානය ප්‍රමුඛ ව එල්ල වූ පාස්කු දින ත්‍රස්තවාදී ප්‍රහාරය යනු ආලෝකය උදා කරන දිනයක සිදු වූ අඳුර උදා වීමකි. සාමය හා ආලෝකය වෙනුවට එබඳු අඳුරක් උදා කිරීමට උත්සුක වූ කිසිවෙකුට තම හෘද සාක්ෂියෙන් හෝ අවසන් විනිශ්චයේ දී හෝ ගැළවීමක් හමුවෙතියි නො සිතමි. එකී කම්පා සහගත අනුවේදනීය සිදුවීම පිළිබඳ අවංක කණගාටුව හා දැඩි සංවේගය පළ කරමි. එම පරීක්ෂණ විධිමත් ව, ඉතා සියුම් ලෙස රජය ඉමහත් කැපවීමෙන් සිදු කරන බව ද මෙහිලා සිහිපත් කරමි. දේව පණිවුඩය අප වෙත ගෙන ආ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මේ ප්‍රාතිහාර්ය දිනය, අපේත්, රටේත් අනාගතයට සුබ ලකුණු දල්වන ප්‍රාතිහාර්ය දිනයක් ම වේවායි ඉත සිතින් ප්‍රාර්ථනය කරමි.

ජේසු පිහිටයි!



**මුනීර් මුලෆ්ෆර්**
නියෝජ්‍ය අමාත්‍ය
ආගමික සහ සංස්කෘතික කටයුතු

සදාකාලික බලාපොරොත්තුව, නව ජීවිතය හා ප්‍රේමයෙන් පිරි පාස්කු මංගල්‍යය උදාවන මේ පූජනීය අවස්ථාවේ, පාඨක ඔබ සැමට අපගේ හද පිරි සුභාශිංසන පුදකරමු. පාස්කු දිනය අපට සිහිපත් කරන්නේ අඳුර පරාජය කර ආලෝකය ජයගන්නා සත්‍යය, විශ්වාසය හා ආදරයයි. එය පමණක් නොව, අපගේ ජීවිත තුළ නව ආරම්භයකට, නව බලාපොරොත්තුවකට හා අර්ථවත් ගමනකට ආරාධනා කරන ආධ්‍යාත්මික මංගල්‍යයකි.

අද දින ලෝකය විවිධ අභියෝග, අපහසුතා මධ්‍යයේ ගමන් කරමින් තිබේ. එවැනි කාලයක පාස්කු පණිවිඩය අපට මතක් කර දෙන්නේ, අඳුරු අවස්ථාවල පවා බලාපොරොත්තුව අත්හැර නොදමා සිටීමට, සමාවෙන් හා කරුණාවෙන් පිරුණු හදවතක් ඇතිව ජීවත් වීමට හා එකිනෙකාට ආශිර්වාදයක් වීමටය. පාස්කුවේ නවෝදය අපගේ සිත් තුළ ද ඉපදෙමින්, අපගේ පවුල්වල, සමාජයේ ද ශක්තියක් බවට පත්වේවායි අපි ප්‍රාර්ථනා කරමු.

පාස්කු මංගල්‍යය අපට සිහිපත් කරන්නේ, කැපවීම හා පරිත්‍යාගය තුළින් උදාවන ජයග්‍රහණයයි. එම ආදර්ශය අපගේ දෛනික ජීවිතයට එක්කර ගනිමින්, යහපත් චින්තනයක් හා ක්‍රියාකාරිත්වයක් ඇති පුරවැසියන් ලෙස අපි ජීවත් විය යුතුය. සත්‍යය, සාමය හා ප්‍රේමය අපගේ මගපෙන්වන්නන් වේවා.

මෙම පාස්කු කලාපය ඔබගේ සිත් සනසන, විශ්වාසය ශක්තිමත් කරන හා නව බලාපොරොත්තුවක් උදාකරන අත්දැකීමක් වේවායි ප්‍රාර්ථනා කරමු. ඔබගේ ජීවිත තුළ සුවය, සතුට, සමෘද්ධිය හා ආශිර්වාද පිරි නව ආරම්භයක් මෙම පාස්කු සමයේ උදා වේවා.

සුභ පාස්කු මංගල්‍යයක් වේවා!



**ප්‍රින්ස් සේනාධීර**
ලේකම්
බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ලොව පුරා විසිරී සිටින කිතුනු බැතිමතුන්ගේ අතිශය ගෞරවයට පාත්‍ර වූ අධ්‍යාත්මික අර්ථයන් පිරිපුන් පාස්කු මංගල්‍යය අද දිනට යෙදී තිබේ.මෙය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණය පරාජය කරමින් උත්ථානය ලැබීම සනිටුහන් කරන නව ජීවනය සහ බලාපොරොත්තුව ලොවට ප්‍රකාශ කරන උදාර අවස්ථාවකි.

මෙම අසිරිමත් පාස්කු සමය නිමිත්තෙන් ඔබ සැමටත් ඔබගේ පවුලේ සියලු දෙනාටත් සාමය සතුට හා ආශිර්වාදය සපිරි අනාගතයක් ප්‍රාර්ථනා කරමි. මානුෂීය අභියෝග සහ විවිධ බාධක මධ්‍යයේ වුවද නොසැලෙන විශ්වාසය පෙරදැරිව ඉදිරියට යාමට අවශ්‍ය ශක්තිය පාස්කු පණිවිඩය තුළ ගැබ්ව පවතී.

අතීතයේ සිදුවූ දෝෂයන් සහ පසුබෑම් අතහැර නවෝදයකට හදවත් විවෘත කර ගැනීම පාස්කු උත්සවයේ සැබෑ අරුතයි. සමාව දීම පරාර්ථකාමීත්වය සහ මනුෂ්‍යත්වය අගය කරමින් අන් අයට උපකාර කිරීම තුළින් මෙම උත්සවයේ වටිනාකම අපගේ දෛනික ජීවිතයට බද්ධ කර ගත හැකිය. අඳුර පරදා ආලෝකය උදා වන බවට වන විශ්වීය සත්‍යය පසක් කරමින් වඩාත් යහපත් හෙට දවසක් පිළිබඳ බලාපොරොත්තුව මෙමඟින් අපට ලබා දෙයි.

ඔබගේ නිවෙස් තුළ සහෝදරත්වය සහ ආදරය රජයන සොඳුරු මතකයන් පිරි අර්ථවත් උත්සව සමයක් වේවායි ප්‍රාර්ථනා කරමි. ඔබ දල්වන සිනහවක් සහ පවසන කාරුණික වචනයක් තවකෙකුගේ ජීවිතය ආලෝකවත් කිරීමට හේතු වන බව නිරන්තරයෙන් සිහිපත් කර ගත යුතු ය.

සමස්ත ලක්වැසි ජනතාව අතර සහජීවනය සහ සාමය තවදුරටත් තහවුරු වන ආශිර්වාදලත් පාස්කු උත්සවයක් වේවා.!



**එම්. චතුරි පින්තු**
අධ්‍යක්ෂ
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

පාස්කු මංගල්‍යය කිතුනුවන් හට අතිශය පූජනීය සහ ආත්මීය වැදගත්කමක් ඇති උත්සවයකි. අපගේ ගැලවුම්කාරයා වූ ක්‍රිස්තුස් වහන්සේගේ මරණයත්, උන්වහන්සේගේ උත්ථානයත් මත පදනම්ව ඇති මෙම මංගල්‍යය, මනුෂ්‍යත්වයට නව ජීවිතයක්, බලාපොරොත්තුවක් හා ජයග්‍රහණයක පණිවිඩයක් ගෙන එයි. පාස්කු දිනය අපට මතක් කර දෙන්නේ අඳුරට ඉහළින් ආලෝකය ජයගන්නා බවත්, දුක හා අසරණකමට ඉහළින් දෙවියන් වහන්සේගේ ප්‍රේමය ජයගන්නා බවත්ය.

ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය මනුෂ්‍යත්වයට දෙන ලද විශාලතම බලාපොරොත්තුවකි. එම නිසා පාස්කු මංගල්‍යය යනු සරලවම ආගමික උත්සවයක් නොව, අපගේ ජීවිත වෙත නැවත හැරී බලා, නව ආරම්භයකට පියවර තබන ආත්මීය අවස්ථාවකි.


මෙම පාස්කු සමයේදී අප සැම දෙනාම ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයෙන් ලබා දුන් උදාහරණය මතක් කරගත යුතුය. උන්වහන්සේ මිනිසුන්ට ඉගැන්වූයේ ප්‍රේමය, සමාව, දයානුකම්පාව සහ එකමුතුකමයි. අපගේ දෛනික ජීවිතයේදී ද එම වටිනාකම් ක්‍රියාත්මක කිරීම කිතුනු අපගේ වගකීමයි. අපගේ විශ්වාසය ශක්තිමත් කරමින්, අන් අයට උපකාර කරමින් සහ ආදරයෙන් පිරි සමාජයක් ගොඩනැගීමට කැපවීම අපගේ වගකීම වේ.

එබැවින් මෙම පාස්කු මංගල්‍යය සැමරීමේදී, අපගේ හදවත් තුළ නව බලාපොරොත්තුවක්, නව විශ්වාසයක් සහ නව ආත්මීය ශක්තියක් ඇති කර ගනිමු. උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේගේ ආලෝකය අපගේ ජීවිත, අපගේ පවුල් සහ අපගේ සමාජය ආලෝකමත් කරත්වායි ප්‍රාර්ථනා කරමි.

සියලු දෙනාටම සාමය, සතුට හා දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය සපිරි සුභ පාස්කු මංගල්‍යයක් වේවා!

# "ජීවමාන තැනැන්වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද? උන්වහන්සේ මෙහි නැත"

**කේ.ජේ. හෙන්රි පෙරේරා**
72, වැබඩ පාර, මීගමුව.



සුභ අස්නේ සුවිශේෂක තුමන්ලා සිව්දෙනාම ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පුනරුජ්ජීවනය ගැන සඳහන් කරන්නේ, උන්වහන්සේ පිහිටවූ කතෝලික සභාවේ මහෝත්තම අවස්ථාව ලෙසය.

මේ අතරින් ලූක් තුමා තම කෘතිය ලියන්නේ ජේසුස් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවගේ ද, මුළු මනුෂ්‍ය වර්ගයාගේ ද මිදුම්කරුවාණන් ලෙස හඳුන්වා දීම පිණිසය. දිළිඳුන්ට සුභ අස්න පැවසීමේ ලා දෙවි පියාණන්ගෙන් වරම් ලබා පැමිණි, ජේසුස් වහන්සේ පිළිබඳව, උන්වහන්සේ ලෝකවාසීන්ගේ විවිධ මිනිස් අවශ්‍යතා ගැන දැක්වූ දයා අනුකම්පාව හා ප්‍රේමය උපතේ සිට ස්වර්ගාරෝහණය දක්වා සඳහන් කරයි. මෙය ක්‍රිස්තු උත්ථානයෙන් වසර පනහක පමණ කාලයේදී ලියන ලද්දක් බව සඳහන් වේ. සුබ අස්නේ කතුවරයන් අතර, යුදා ජාතික නොවූ එකම කතුවරයාද මෙතුමාය. එබැවින් මෙම ලිපිය ශුද්ධවර ලූක් තුමා ඇසුරෙන් ලිවීමට මම අදහස් කළෙමි.

ස්වාමීන් වහන්සේගේ පුනරුජ්ජීවනය කතෝලික සභාවේ නොමැකෙන දීප්තිමත් ලාංඡනයයි. අද මුළු ලෝකය පුරා පැතිර ගත් කතෝලික සභාව හා ධර්මයන් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව විශ්වාසය පෙරදැරි කරගත්, වෙනත් ධර්මයන් ද, ලෝක ජනතාවගෙන් අඩකුත් ඉක්මවා පැතිර පවතී.

ස්වාමීන් වහන්සේ තමන් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳව අවස්ථා කිහිපයකදීම තම ශ්‍රාවකයන් හා ජනතාව දැනුවත් කළ නමුත් ඒ පිළිගැනීමට තරම් අවබෝධයක් ඔවුන් තුළ නොතිබිණි. ඒ ලොව කවර අවස්ථාවක වත් මෙවන් සිදුවීමක් නොසිදු වීම හා ඒ සිදුවීමට ඉඩක් නොමැති වීම හෙයිනි.

උන්වහන්සේ කුරුසියේ උකුත් වී මළ පසු, දුෂ්ට හෙරොද්ගේ හා නායක පූජකයන්ගේ පිරිස් අමන්දානන්දයට පත් වූහ. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයෙකු වූ අරිමතියාවේ ජෝසප් නැමැත්තා ස්වාමීන් වහන්සේගේ මළ සිරුර, තමා සඳහා නිමකළ සොහොන්ගෙයි තැන්පත් කිරීමට අවසර ලබා ගත්තේය.

උන්වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳව කවුරුන් මොන සැක පහළ කලත් දිවැසිවර යෙසායා තුමන් කර ඇතැයි පල කළ අදහසක් අනුව, ක්‍රිස්තුස් වහන්සේගේ දෙන වටා හෙරෝද්ගෙ රාජපුරුෂයෝ රැකවල් කළහ.

ස්වාමීන් වහන්සේ තමාගේ පුනරුජ්ජීවනය පිළිබඳව අවස්ථා කීපයකදීම තම ශ්‍රාවකයන් දැනුවත් කිරීමට සිතුවත් ඔවුන් එය සිතට ගන්නා බවත් නොපෙනිණි. ස්වාමීන් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් පිළිබඳව සියල්ලන් පුදුමව සිටියදී, "උන්වහන්සේ තම ශ්‍රාවකයන්ට කතා කොට මා කියන දේ සාවධානව සිතට ගන්න මනුෂ්‍ය පුත්‍රයාණන් මිනිසුන් අතට පාවා දෙනු ලබන සේක යි වදාළ සේක ඔවුන්ට අවබෝධ නො වී ය. එය ඔවුන්ට ඒ කීම නොවැටහී සැඟවී තිබිණි. ඔවුන් ඒ කීම ගැන උන්වහන්සේගෙන් ඇසීමටත් බිය වූහ." (ශු.ලූක්.9:44-45)

තවත් වරෙක "උන්වහන්සේ දොළොස්දෙනා තමා වෙත කැඳවා ඔවුන්ට කතා කරමින්" මෙන්න දැන් අපි ජෙරුසලමට යම්හ. මනුෂ්‍ය පුත්‍රයාණන් ගැන දිවැසිවරුන් විසින් ලියා ඇති සියල්ල ඉෂ්ඨ වන්නේමය. කුමක් නිසාද උන්වහන්සේ විජාතිකයනට පාවා දෙනු ලබනු සේක. ඔව්හු උන්වහන්සේට සරදම් කොට අපහාස කර කෙළ ගසන්නාහ. ඔවුහු උන්වහන්සේ කසවලින් තළා මරන්නෝය. එහෙත් තුන්වනදා නැවත උත්ථානවන සේකැ" යි වදාළ සේක. මේ දේ වලින් කිසිවක් ඔවුන්ට අවබෝධ නොවිය. (18:31-34).

සදිසිවරු උන්වහන්සේ ට පැණයක් ඉදිරිපත් කරමින්, යම් මිනිසෙක් භාර්යාව ජීවත්ව සිටියදී දරුපල නොලබා මියගියහොත්, ඔහුගේ සහෝදරයා ඒ භාර්යාව පාවාගෙන. තම සහෝදරයා නමට දරුවන් බිහිකළ යුතු යයි මෝසෙස් ලියා ඇති බැවින්, ඒ ආකාරයෙන් පිළිවෙලින් සොයුරන් සත්දෙනාම දරුපල නොමැතිව මිය ගියහොත්, බිරිඳද මිය ගියහොත්, ඒ පුනරුජ්ජීවනයදී ඒ කාගේ භාර්යාව වන්නේදැයි ප්‍රශ්න කිරීමේ දී, උන්වහන්සේ වදාලේ, "මේ යුගයට අයත් වූවෝ ආවාහ විවාහ වන්නාහුය. එහෙත් එන යුගයට හා පුනරුජ්ජීවනයට පැමිණි මට වරම්ලත් අය ආවාහ වන්නේවත්, විවාහ වන්නේවත් නැත, ඉන්පසු ඔවුන්ට මරණයක් නැත. ඔවුහු දේවදූතයන්ට සමවෙති. පුනරුජ්ජීවන වරය ලත් බැවින් ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය.", (20:34-36) යනුවෙන් පිළිතුරු දුන්සේක.

ස්වාමීන් වහන්සේගේ පුනරුජ්ජීවනය ඉටුවන තුරුම එය ලෝකයාට මහ අරුමයක් හා නොසිදුවිය හැකි මහා ප්‍රාතිහාර්යක් වූයේය. උන්වහන්සේගේ මහා ප්‍රාතිහාර්ය පෑම් දුටු ශ්‍රාවකයිනට හා නායක පූජක හා බාහිර පිරිස්වලටද ඒ උභතෝකෝටිකයක් විය.

**ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය.**

"සතියේ පළමු වන දින හිමිදිරි උදයේ තමන් සූදානම් කළ සුවඳ ද්‍රව්‍ය රැගෙන ස්ත්‍රීහු සොහොන් ගෙය ළඟට ගියාහු. ගල සොහොන් ගෙයින් ඉවතට පෙරළා තිබෙනු දුටුවෝ ය. ඔවුහු ඇතුළුවූ කල ජේසුස් ස්වාමීන් වහන්සේගේ ශරීරය නොදුටුවෝය. ඒ ගැන ඔවුන් වියවුල් ව සිටිය දී, කාන්ති විහිදුවන වස්ත්‍ර ඇඳගත් මනුෂ්‍යයෝ දෙදෙනෙක් ඔවුන් ලඟ සිටියහ. ඒ දුටු ඔවුන් බිය පත්ව තම තමන්ගේ මුහුණු බිමට හරවා ගත් කල, ඒ මනුෂ්‍යයෝ කතා කොට,ජීවමාන තැනන් වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද? උන් වහන්සේ මෙහි නැත උන් වහන්සේ උත්ථාන වූ සේක. මනුෂ්‍ය-පුත්‍රයාණන් පව්කාර මිනිසුන්ගේ අත්වලට පාවාදෙනු ලබන්නටත්, කුරුසියෙහි ඇණ ගසනු ලබන්නටත්, තුන් වන දා නැවත නැගිටින්න ටත්, යුතුමය කියා උන්වහන්සේ ගලීලයේ සිටිය දී පැවසූ හැටි සිහි කරන්නැයි ඔවුන්ට කීහ. (24:1-7)





# පේසාලෙයි ඓතිහාසික පාස්කු දර්ශනය

අසේල දසනායක

මධ්‍යතන යුගයේ ප්‍රංශය, එංගලන්තය, ජර්මනිය වැනි රට වලින් ආරම්භ වූ මෙම භක්ති අභ්‍යාස පසුකාලීනව පෙරදිග හා අපරදිග රටවලට සපැමිණි ධර්මදූතවරුන්ගේ ධර්මදානීය මෙහෙවරේ සුවිශේෂාංගයක් ලෙස නම් කළ හැකිය. මේ අනුව ඉන්දියාවේ ගෝවා ප්‍රදේශය, පිලිපීනය, ආජන්ටිනාව, සැල්වදෝරය වැනි රටවල නත්තල්, පාස්කු හා සුවිශේෂි මංගල්‍යයන් අරඹයා නාට්‍යානුසාරයෙන් ධර්මදානය ලබා දෙන ලදී. පාස්කු නාට්‍ය කලාව ගෝව ප්‍රදේශය ඔස්සේ අප දේශයට සංක්‍රමණය වූ උප සංස්කෘතික ලක්ෂණයක් ලෙස නම් කළ හැකිය. එහි මූලාරම්භය ලෙස ස්පාඤ්ඤයේ වීදි සංචාරයේ කිරීමේ කිරීමේදී රංගගත වූ "ඕටෝස්" නම් කෙටි නාට්‍යය භක්ති අභ්‍යාසය නම් කළ හැකිය. පසුව ස්පාඤ්ඤයේද, පෘතුගාලය ද, පෘතුගාලයෙන් ඉන්දියාවේ ගෝවේද, ගෝවෙන් එය ආසියානු සංස්කෘතින්ට ඔබින ලෙස ව්‍යාප්ත විය.

16 වන ශත වර්ෂයේදී පෘතුගීසින් ඉන්දියාවට පැමිණීමෙන් පසුව කතෝලික ධර්මය ප්‍රචාරය වීමත් සමඟ ඊට විරුද්ධ වූ ඇතැම් හින්දු හා ඉස්ලාම් භක්තිකයන් කතෝලික ධර්මය වැළඳගත් ජනතාවට පීඩා කිරීමට යොමුවිය. මෙහිදී මෙම ප්‍රදේශයේ තල් ගස් හා මහ සයුර මුල් කොටගත් ජීවන වෘත්තීය මුල් කරගෙන ධීවර වෘත්තීය තම ජීවනෝපා මාර්ගය කරගත් ජනතාව මන්නාරම දූපතේ පේසාලෙයි ප්‍රදේශයේ බටහිර වන්නට වූ කුඩිඉරුප්පුව ප්‍රථමයෙන් පදිංචි වී තම ධීවර රැකියාවේ යෙදුණාහ. ඇතැම් ජනප්‍රවාද හා කතාවන්ට අනුව චෙකරාසසේකරන් හෙවත් සංකිලි රජය විසින් මන්නාරමේ විසූ කිතුනුවන් හට එල්ල කරන ලද සංහාරයේදී මෙම ප්‍රදේශයේ ජීවත් වූ වැසියන්ට කිසිදු හානියක් සිදු නොවුණු බව සඳහන් වේ. මෙහි ජීවත් වන වැසියන් බොහොම දෙනෙකු පරවර සහ කරයාර් හෙවත් කරෙයියාර් කුලයට අයත් වෙති. පෘතුගීසි යුගයේ මෙරට පැවති දේවස්ථාන අතුරින් පේසාලෙයි ග්‍රාමයේද දේවස්ථානයක් පැවති බව ක්වේරෝස් සහ ත්‍රින්දාදේ යන පෘතුගීසි සමයේ විසූ ඉතිහාසවේදීන් පෙන්වා දී ඇත. ඒ අනුව පෘතුගීසි සමයේ දී ජේසු නිකායික ධර්මදූතවරුන් යටතේ පැවති දේවස්ථානයක් ලෙස පේසාලෙයි හි සාර්ථකත්වයේ අප ස්වාමිදු නමින් දේවස්ථානයක් කැපකර තිබුණි. මෙහි කිතුනුවන් 490ක් ද, සිසුන් 80ක් ද සිටි බව කියැවේ.

ශු. ජුසේ වාස් මුනිඳුන්ගේ හා අති පූජ්‍ය පඬිවර ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමන්ගේ සුවිශේෂි දායකත්වයෙන් මෙරට ප්‍රතිමා පාස්කුව ක්‍රි.ව. 1705 දී වන්නියෙන් ආරම්භ වූ අතර, මෙම පාස්කු නාට්‍ය සඳහා ප්‍රතිමාවන් ගෝවෙන් රැගෙන ආ බව සඳහන් වේ. එම ප්‍රතිමා අදත් මන්නාරමට නොදුරු පරපාන්කන්ඩල් දේවස්ථානයේ දේවස්ථානයේ දක්නට ඇත. එම සම්ප්‍රදාය අනුව යමින් ගෝවේ ඔරතෝරියාන නිකායික පියවරුන්ගේ සුවිශේෂී දායකත්වය තුළ පේසාලෙයි හි විජයග්‍රහණයේ අප ස්වාමිදූගේ දේවස්ථානයට අනුබද්ධිතව ඓතිහාසික පාස්කු දර්ශනය ආරම්භ වූ බව සඳහන් වේ. මෙම පාස්කුව වසර තුන්සියයකට ආසන්න ය. ලාංකේය පාස්කු නාට්‍ය කලාව පිළිබඳව හා එහි ඉතිහාසය පිළිබඳව ගවේෂණාත්මක වාර්තාවක් ඉදිරිපත් කළ මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතාගේ " සිංහල ගැමි නාටකය" නම් කෘතිය තුළ පෙන්වා දෙන්නේ පුරාතන ම පාස්කු නාට්‍ය සම්ප්‍රදාය පේසාලේ ග්‍රාමයේ රංග ගත වන බවත්, මෙහි රඟ දක්වන රූකඩ නූල් වලින් ක්‍රියාත්මක වන බවයි.

ක්‍රි.ව. 1705දී මුලින්ම පාස්කු රඟ දැක්වීමට ගෝවෙන් රැගෙන එන ලද ප්‍රතිමා වල විශේෂත්වය වූයේ මේ ප්‍රතිමා ලීයෙන් නෙළා තිබීමය. නමුත් ඒවායෙහි ලීයෙන් නෙළා තිබුණේ හිස, පාද, දෙඅත් පමණි. ශරීරයේ මැද කොටසට ලීයක් තබා පිදුරු, පුළුන් යොදා ඇඳුම් ආයිත්තම්වලින් සරසා තිබිණි. මුල් යුගයේ පැවති පාස්කු දර්ශන නිහඬව රඟ දැක්විණි. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා මේ නිහැඬියාව බිඳ හැරියේ දුක්ප්‍රාප්ති ප්‍රසංගය සහ දේශනා නවයේ පසම් පොත තුළිනි. දමිළ බසින් එය ව්‍යාකූල මාතා පීරසංගම් ලෙස හැඳින්වේ.

එමඟින් මුළු දුක්ප්‍රාප්තිය සතිය හතකට බෙදා දේශනා 09කට සකස් කොට ඉදිරිපත් කළේය. මේ දේශනා උස් හඬින් උච්චාරණය කරන විට එදිනට අදාළ ජවනිකාව ප්‍රතිමා මඟින් (රූප විලාසය) වේදිකාවේ රංගගත කෙරිණි. මෙම දේශනා බොහෝ විට උච්චාරණය කරන ලද්දේ පූජාප්‍රසාදිතුමකු විසිනි. මෙම ප්‍රතිමා පාස්කු සම්ප්‍රදාය අදත් පේසාලෙයි ග්‍රාමයේ දක්නට ඇත.

මෙහිදී ක්‍රිස්තු චරිතය උදෙසා ප්‍රතිමා 09ක් පමණ භාවිතා කළ බව සඳහන් වේ. ඒවා නම්

- ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤා කරමින් සිටින සුරුවම
- ජේසුස් වහන්සේ සිරගතව සිටින සුරුවම
- ජේසුස් වහන්සේ අඩනිරුවත් කොට ගල්කණුවේ බැඳ දමා ඇති සුරුවම
- ජේසුස් වහන්සේ කටු ඔටුන්න සහිත සුරුවම
- ජේසුස් වහන්සේ පිලාත් අභිමුව සිටින සුරුවම
- ජේසුස් වහන්සේ කුරුසේ කරගසා ගත් සුරුවම
- ජේසුස් වහන්සේ කුරුසිය ඇණ ගසා සිටින සුරුවම
- ජේසුස් වහන්සේ කුරුසිය මත මිය ගිය සුරුවම
- ජේසුස් වහන්සේ කුරුසියෙන් බා මරි මවගේ උකුලේ තබා තිබෙන සුරුවම යනුවෙනි. (මේවා පේසාලෙයි පාස්කු නාට්‍ය සම්ප්‍රදාය තුළ අදත් ක්‍රියාත්මක විම සුවිශේෂී දසුනකි.)

තවද පේසාලෙයි පාස්කු නාට්‍ය සම්ප්‍රදාය මෙරට පෘතුගීසි සමයේ දී ජේසු නිකායක ධර්මදූතවරුන් දායාද කරන ලද නාට්‍ය සම්ප්‍රදායන් දෙකක් ඔස්සේ ක්‍රියාත්මක වේ. ඒ අල්පාස් සහ උඩක්කුපාස් යනුවෙනි. මෙහිදී අල්පාස් යනු මිනිස් නළුවන් යොදා රඟදැක්වූ නාට්‍ය සම්ප්‍රදායක් වන අතර, උඩක්කුපාස් යනු ප්‍රතිමා නිරූපණය කර ගනිමින් රඟ දක්වනු ලබන නාට්‍ය සම්ප්‍රදායක් වේ. දකුණු ඉන්දියාවෙන් අපට උරුම වූ නාඩගම් සම්ප්‍රදාය මුල්කරගෙන හලාවත, දූව සහ පිටිපන මෙන් නත්තල් මංගල්‍යය මුල්කරගනිමින් "රජතුන් කට්ටුවේ නාඩගම" ප්‍රථම වරට යාපනයේ දී දමිළ බසින් රඟදක්වනු ලැබූ ලොරෙන්සු පුලවර් නැමති පඬිවරයා සඳහන් කර ඇත. එතුමන්ගේ එම වාර්තාවට ම අනුව මීට සමගාමීව දේවස්ථාන අසල වේදිකා හෙවත් අට්ටාල ඉදිකරනු ලැබූ බවත්, විශේෂ අවස්ථාවන්හිදී ඒවායේ ආගමික කතා වස්තු රංග ගත කළ බවත් සඳහන් කරයි.

7 පිටුවට >>>

**පේසාලෙයි ඓතිහාසික පාස්කු දර්ශනය** 6 පිටුවෙන් >>

ඒ පිළිබඳව ලන්දේසි යුගයේ ප්‍රවීණ ඉතිහාසඥයකු වන පිල්ප්පුස් බල්දේවුස් දේවගැතිවරයාගේ සටහනේද සඳහන් කරයි. මෙම අට්ටාල හෙවත් රඟ මඩුලු තුළ රංගගත කරන ලද නාට්‍ය සඳහා පස්සාම් කඩ්චිකල් Passum Kadchikal යන වචනය භාවිතා කරන්නට වූ බව කියැවේ. ඉහත සඳහන් කරන ලද උඩක්කුපාස් Udakku Pas හෙවත් වේදිකාව මත රඟ දක්වන ලද පාස්කු නාට්‍ය නිසා පේසාලේ ග්‍රාමයේ කීර්තිය අද රැව් පිළිරැව් දී ඇත.

ක්‍රි.ව. 1863 වර්ෂයේදී ඔබ්ලෙට් නිර්මල මරිය නිකායික ගෞ. පීටර් මරියෝ බ්‍රටින් පූජාප්‍රසාදීන් වහන්සේ විසින් දේවස්ථානයට දකුණු පසින් පොල් අතු පැලක ප්‍රතිමාවන් උපයෝගී කරගනිමින් මහා පාස්කුවක් රඟ දැක්වූ බව ලේඛනයන්හි සඳහන් වේ. මෙහි රංගගත කිරීම් දිවා කාලයේ දී සිදුකළ බවත් එම දර්ශන නැරඹීම සඳහා පැමිණි ජනතාවගේ පහසුව පිණිස "පන්දලමක්" ග්‍රාමීය ජනතාවගේ සහයෙන් ඉදිකරනු ලැබූ බවත් සඳහන් කර ඇත.

ක්‍රි.ව. 1890 වසරේ දී ඉන්දියාවේ මනක්කාඩු ප්‍රදේශයේ සිට ප්‍රතිමා දෙකක් පේසාලෙයි දේවස්ථානයට රැගෙන ආ බව සඳහන් වේ. ඒ අතුරින් යාගික කිතු සමිඳුන්ගේ ප්‍රතිමාව සහ මෙන්න මනුෂ්‍යයා හෙවත් Ecce Homo ප්‍රතිමාව අදත් සැදැහැවතුන්ගේ ගෞරව අභිමානය ලබන්නේය. විශේෂයෙන් මෙන්න මනුෂ්‍යයා හෙවත් Ecce Homo ප්‍රතිමාව වෙතින් ප්‍රාතිහාර්යයන් සිදුවන බව ජනතාවගේ දැඩි විශ්වාසය වන අතර, අදත් මෙම ප්‍රතිමාව වෙත පැමිණ තම රෝගාබාධ හා ඉල්ලීම් ඉල්ලා සිටින ජනතාව අපමණය.

මෑතක් වනතුරු ම දුවේ පාස්කු දර්ශනය සඳහා භාවිතා කළ පොල් අතු සහ දැවමය පාස්කු මණ්ඩපය මෙන් අට්ටාල තැනීමේ සම්ප්‍රදායක් පේසාලෙයි පාස්කු දර්ශනයට ද පසුබිම් ව පැවති අතර ක්‍රි.ව. 1906 වසරේ දී එවකට පේසාලෙයි මීසම් සේවක පියතුමා ලෙස පැමිණි ඔබ්ලෙට් නිර්මල මරිය නිකායික ගෞ. ප්‍රලේකායිසිංහම් පූජාප්‍රසාදීන් වහන්සේ විසින් දේවස්ථානයට වම් පසින් පිහිටි ස්ථාවර පාස්කු මණ්ඩපය ඉදිකරන ලදී. මෙහි දිග අඩි 75ක් ද, පළල අඩි 61ක් ද, උස අඩි 40කින් සමන්විත වන අතර, මෙම පාස්කු මණ්ඩපයේ ඉහල , මැද හා පහළ යනුවෙන් වේදිකා තුනකින් සමන්විත වේ. පාස්කු රංගනය වඩාත් තීව්‍ර කිරීම සඳහා වේදිකාව දෙපසින් විවිධ පැති ආවරණය වන පඩිපෙළවල් කීපයක්ද දැකගත හැකිය. තවද ප්‍රතිමා එහා මෙහා ගෙන යාමේ දී හා ඒවා අංග චලනය කිරීමේදී ප්‍රේක්ෂක සැදැහැවතුන්ගේ ඇස නොග ැටෙන පරිදි වේදිකාවට පහතින් උස් තාප්පයක් සාදා තිබීම ද සුවිශේෂී ලක්ෂණයකි. මෙම ඓතිහාසික පාස්කු මණ්ඩපයේ ප්‍රථම රඟ දැක්වීම 1907 ශුද්ධවූ සතියේ දී සිදු කළ බව සඳහන් වේ.



**ක්‍රි.ව. 1705දී මුලින්ම පාස්කු රඟ දැක්වීමට ගෝවෙන් රැගෙන එන ලද ප්‍රතිමා වල විශේෂත්වය වූයේ මේ ප්‍රතිමා ලීයෙන් නෙළා තිබීමය. නමුත් ඒවායෙහි ලීයෙන් නෙළා තිබුණේ හිස, පාද, දෙඅත් පමණි. ශරීරයේ මැද කොටසට ලීයක් තබා පිදුරු, පුළුන් යොදා ඇඳුම් ආයිත්තම්වලින් සරසා තිබිණි.**

පේසාලෙයි පාස්කු නාට්‍ය පෙන්වීම ශුද්ධවූ සතියේ සෙනසුරාදා හැර අනෙකුත් දින හය පුරාම සිදු කර ඇති බව ද, ඇතැම් දිනවලදී දිවා කාලයේ දී මෙදී මෙන්ම රාත්‍රී කාලයේදීත් පාස්කු දර්ශන පෙන්වූ බවට සාධක ඇත. මෙම දර්ශන සඳහා කානාහි විවාහ මංගලය, අංශභාග රෝගියා සුව කිරීම, ජේසු සමිඳුන් ගේ බව්තීස්ම -ස්නාපනය, යක්ෂයා පරික්ෂා කිරීම, ශ්‍රාවකයන් තෝරාගැනීම, දේවමාලිගාවේ වෙළඳුන් පලවා හැරීම, සමාරිය ස්ත්‍රිය සමග සාකච්ඡා කිරීම සහ මෙසියස් වහන්සේ බව දැන්වීමේ පුවත, අන්‍ය රූප විලාශ වීම , ස්නාවක ජුවාම් තුමාගේ හිස ගසා දැමීම, ජේසු සමිඳුන් රාජශ්‍රීයෙන් කොටළුවා පිටින් ජෙරුසලමට පැමිණීම වැනි ජේසු සමිඳුන්ගේ ජීවිතයට සම්බන්ධ සුවිශේෂ සිදුවීම් මෙහි රඟ දක්වා ඇති අතර මහ බ්‍රහස්පතින්දා සහ මහ සිකුරාදා දින ප්‍රතිමා උපයෝගී කරගනිමින් ජෙත්සමෙනි යාච්ඤාවේ සිට ජේසු සමිඳුන්ගේ දුක්ප්‍රාප්තිය හා මරණයත්, පාස්කු ඉරිදා දින උත්වහන්සේගේ විජයග්‍රහණයේ උත්ථානයේ සිදුවීම්ද මෙසේ ප්‍රතිමා උපයෝගී කරගෙන රඟ දක්වා ඇති ආකාරය පිළිබඳව සඳහන් වේ. මෙම මහා පාස්කු දර්ශනය සඳහා 90%ක් ම පාහේ ප්‍රතිමා උපයෝගී කරගත් අතර ජේසු සමිඳුන් ගේ ශ්‍රී දේහය ගල්ලෙනෙහි තැන්පත් කිරීම සඳහා නිකදෙමුස් සහ අරමිතියාවේ ජෝශප් යන චරිත සඳහා සහ උන්වහන්සේගේ ශ්‍රී දේහය රැගත් සයනාසනය ඔසවා ගෙන යාම සඳහා මිනිස් නළුවන් ක්‍රියා කරයි.

මෙසේ කුරුසියෙන් බාන ලදුව උන්වහන්සේගේ ශ්‍රී දේහය රැගත් සයනාසනය ග්‍රාමය පුරා වීදි සංචාරය කිරීමෙන් පසුව එළඹෙන වසර දක්වා එය නැවත දේවස්ථානයේ මංජුසාවක තැන්පත් කරන ලද ලබයි. මෙම පාස්කු දර්ශනයේ ප්‍රධාන මෙහෙයුම්කරු ලෙස ක්‍රියා කරනු ලබන්නේ මුහුප්පු ධූරය හොබවන්නා විසිනි. ඔහුගේ නායකත්වය තුළ සංවිධායක මණ්ඩලයක් මේ සඳහා පත්කෙරෙන අතර මුහුප්පු ධූරය හොබවන්නා මුදල් ත්‍යාග යක් පිරිනමා පාස්කු දර්ශනයේ කටයුතු නිල වශයෙන් ආරම්භ කරයි. සම්ප්‍රදානුකූලව ප්‍රථමයෙන් නිර්මාණය කරනු ලබන්නේ ශු. පේදුරු අපොස්තුළුතුමන්ගේ ප්‍රතිමාව වේ. පාස්කු දර්ශනය රඟදැක්වීමට පෙරාතුව චතාරික කාලයේ සති කීපයක් ගම්වැසියෝ මර්දන ක්‍රියා කරමින්, උපවාස පවත්වමින් මේ සඳහා ආධ්‍යාත්මිකව සූදානම් වන අතර, මෙහි ප්‍රධාන සංවිධායකයා වන මුහුප්පු රාළ වෙත සියළු දෙනා අවනත ව ඔහුට සහයෝගය දක්වයි. ඒ අනුව ඔහු විසින් පාස්කු මඩුවේ සිදුවන සියලු කටයුතු සොයා බැලීම සිදුකරන අතර, මෙහිදී ඔහුගේ කාර්යභාරය ඉතා සුවිශේෂී වේ. වාර්තාගත තොරතුරු වලට අනුව මෙම ඓතිහාසික පාස්කු නාට්‍ය සෑම වසරකම රංග ගත කළ බවට සාධක නැත. විශේෂ කොට ජනවාර්ගික යුධමය වාතාවරණයක් අවස්ථාවේදී බොහෝ පුද්ගලයින් විදේශගත වූ අතර, මෙම දෙව්මැඳුර හා අවට පාස්කු මඩුව තුළද ජනතාව තම ආරක්ෂාව පතා පදිංචි වූ බව සඳහන් කළ යුතුමය.

මෙවන් පසුබිමක් තුළ පාස්කු නාට්‍ය සිදු කිරීම සඳහා යොදාගත් පෞරාණික භාණ්ඩ නාස්ති වී ගිය අතර, මේ හේතුවෙන් වසර ගණනාවක් කිසිදු පාස්කු රංගනයක් කිරීමට ඔවුනට නොහැකි විය. ජනවාර්ගික යුද්මය වාතාවරණයට පෙර අවසාන වතාවට මහා පාස්කුව රංගගත කරන ලද්දේ 1983 වසරේදීය. නැවත වරක් 1998 වසරේ දී සහ 2000 ක්‍රිස්තු ජයන්තිය වෙනුවෙන් ග්‍රාමයේ තරුණ පරපුර විසින් නැවතත් මෙම ඓතිහාසික පාස්කු නාට්‍ය රඟදැක්වීමට උත්සාහ දැරුවත් එය විවිධ හේතූන් මත ව්‍යර්ථ වූ බව සඳහන් කළ යුතුමය. ඒ සඳහා බලපෑ ප්‍රධානතම සාධකය වූයේ ඓතිහාසික පාස්කු මණ්ඩපය විනාශ වී තිබීමත්, එය අලුත්වැඩියාව සඳහා විශාල මුදලක් වැය වීමත්, පාස්කු සංදර්ශනයට අවශ්‍ය බඩු බාහිරාදිය විනාශ වී තිබීම සහ පාස්කු දර්ශනය නැරඹීමට පැමිණෙන සැදැහැවතුන්ට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීමත්ය. එනමුදු යුද්ධය නිම වීමත් සමගම නැවත වරක් 2012 වසරේ සිට මෙම මහා පාස්කුව වසර දෙකෙන් දෙකට රඟදැක්වීම සිදු කෙරේ. මේ අනුව මහා පාස්කු නාට්‍ය රඟ දැක්වීම සඳහා කලක් පේසාලෙයි හි පාතිමා විද්‍යාලයේ ක්‍රීඩා භූමි පරිශ්‍රය භාවිතා කළ අතර, වර්තමානයේ මෙහි හඬ කැවීම් උපයෝගී කරගෙන පාස්කු දර්ශනය රඟ දක්වනු ලබයි. 2012 වර්ෂයේදී මහා පාස්කු දර්ශනයක් රඟ දක්වා එය අන්තර්ජාලයටද මුදාහැර ඇත. මෙමඟින් ලාංකේය පාස්කු දර්ශනයේ කීර්තිය මුළු ලොවටම ප්‍රකාශ කිරීමට පේසාලෙයි පාස්කු දර්ශනය කදිම දායකත්වයක් ලබා දී ඇත.

# ජේසුට ළංව ශ්‍රී කුරුසයෙන් ජය ලබමු.

ලෝ සවි සතට කළාවූ මහ ප්‍රේමෙ නිසා
රුදුරු ජුදයෝ දුන් සියලු දුක් ගැහැට ඉවසා
පිය නගා ගියෙ කල්වාරියට විඳ සා පිපාසා
ප්‍රති ප්‍රේමය පුදමු කරට ගෙන අපි සිරි කුරුසා..

එන කල පාස්කුව කල්වරි ප්‍රේමය රැගෙන
සැරසෙමු වැළඳ ගන්නට එය අදරින..
පිටු දැක පාපෙ පව් සමාව ලැබගෙන
කිතු හිමි ගිය මග යමු කුරුස දරාගෙන..

චතාරිකය අරුත්බරව ගෙවන්න
දයා ප්‍රේමයෙන් යුතුව අනුනට සලකන්න
බර පාපයට නිතරම තිත තබන්න..
ජේසුට ළංව ශ්‍රී කුරුසෙන් ජය ලබන්න..

**ඩිලීෂියා තිලකරත්න**
නිශාමිණී, වල්දෙනිය, කෑගල්ල.

# කුරුසියේ යාගය

ජේසුගේ ආදරයමයි අප හට පෙන්වූයේ
කුරුසියේ යාගය තුලින්මයි අප එය දුටුවේ
අපගේ පව්බරින් අප ගලවා ගත්තේ

ජේසුනී වෙනු මැනේ අපහට පව්සමා
දුබල මිනිස්ගති නිසාම වැරදී වූවා
ඔබතුමාගේ ආදරයේ සීමාවක් නැති බව දුටුවා
හද බැතියෙන් ඉකි බිඳිමි අසරණ මෙමා

ඔබ දෙසූ දහම අප ජීවිත වලට අගෙයි
යහ මග යන්නට අප හට මග පෙන්වයි
ඔබ අඩිපාරේ යන්නට ඉන් මග පෑදෙයි
අප ජීවිත වලට ආලෝකය ඔබෙ දහමයි

**හිල්ඩා කුමාරපේරු**
දඹදෙණිය මීසම





# කුලකයක් මත දිවි ගෙවෙන මිනිසා

සාම්ප්‍රදායික
හෝ හා සමග
නවප්‍රගමනව
දැනුම ආකල්ප කුසලතා
මතින්
සැකසූ වපසරි ලොවකට
හිස් වූ උපතින්
බීජයක්ව හිඳ
දළු ලා වැඩෙයි
මේ මිනිසා...

ධනය
බලය
සමගින්
කීර්තිය ද
රැස් කිරීමේ
තරගයකට පිවිසේ
හිස්ව උපන්
මේ මිනිසා

කුලකයක් මත දිවි ගෙවා
වැය කළද කාලය
කව්රුන්ද දුටුවේ
මේ මිනිස් යථාර්ථය

කොටුවකට වී සිටින
මේ මිනිස් කුලකයේ
මිනිසුන් වී මිය යමුද?
නොමිනිසුන් වී මිය දෙමුද?

**ඩබ්. අචිනි නිර්මලා ප්‍රනාන්දු**
සංවර්ධන නිලධාරී

# පුත් කුමරාද මේ

ජේසුනි දයාබර ජේසුනි මසිත මත
තෙරපෙන අදහසක් කරුණක් නිතර ඇත
කුරුසය කරදරා ඔබ කල්වාරි වෙත
යන දා ළඟම සිටි අය ළඟ පාත නැත

අතහැර සියල්ලෝ සැඟවී යන දවසේ
අම්මා පමණි ආවේ හඬමින් දුකසේ
උතුරා ගලා යන උණු කඳුලැලි දෙඇසේ
දැක දැක පුතේ ඔබ පා නැඟුවද කෙලෙසේ

ඉල්ලා පිළිසරණ අම්මා දෝත් නගා
මා රුදු ජුදාසෙන් පා මුළ කඳුළ වුණා
බලයෙන් උමතුවුන ජුදයින් බොහොම දෙනා
කඳුලද පාගා පාගා දුනි වියරු සිනා

රැකගත් හෙරෝදිගේ මරු අසිපත් පහරින්
පුත් කුමරාද මේ වාවනු දෝ කෙලෙසින්
ශ්‍රීවත මඩල මැළවේ ලේ උණු කඳුලින්
නීතිය නොවේ පාපය කිම පල දරමින්

පුත ඔබ පිරිවරා සිටි අය සොයමි මම
කිසිවෙකු නොමැත පාළුයි මුළු පෙදෙස මෙම
ගත සිත වටා ඇත්තේ හෝ සුසුම් දුම
විසඳුම් සොයමි විමසමි කළ වරද කිම

තනිවී කුරුස ගස පා මුළ සිටින පැයේ
ආලෝකයක් දිස්වී දිළි දිළිම තියේ
පුතුගේ රුවයි වී එළියෙන් මැවුණි ළයේ
පුත යළි ජනිතවී දුකඳුර පහව ගියේ

**පිටිපන මා ජයවීර**

# චතාරිකය

කාලය මෙහි ගලා යන්නේ
මන්දගාමී පාවෙමින්
හදවතටම කතාකරන
නිහඬ පැයකට
ශබ්දය අඩුවෙයි...
නමුත් ඇසෙන්නේ
අතහැර දැමූ
අපේම අභ්‍යන්තර හඬ...
උපවාසය
බඩට පමණක් නොව
ආඩම්බරයට
කෝපයට
අමතක කළ කරුණාවට...

කුරිසිය ,
වේදනාවේ සංකේතයක් නොව
අසීමිත ආදරය
මිනිසාට දරාගත්
දෙවියන්ගේ නිහඬ ප්‍රකාශයයි...

අලු බිඳක්
නළල මත තැබූ විට
මතක් වන්නේ
අවසානය නොව
නව ආරම්භයක් ...
පසුතැවීම
බරක් වගේ හැඟුනත්
එයයි
සුවයට විවරවන
පළමු දොර ...

චතාරිකය
අඳුරට ගමනක් නොව
ආලෝකය සොයා
අපි අපමණක්
හමුවෙන මාවතය...

**ක්‍රිස්ටියානා කුමාරසිංහ**
යහපත් එඬේරා කන්‍යාරාමය
පානදුර.



# පරිණත මිනිසාගේ පාස්කුව : පැවැත්මේ අර්බුදයෙන් නිදහස් වීම

ඇන් හිරන්ති ද සිල්වා
කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

විසිඑක්වන සියවසේ ශ්‍රී ලාංකේය සමාජ අවකාශය තුළ තාරුණ්‍යයේ උන්මාදය පසුකර, ජීවිතයේ පරිණත සන්ධිස්ථානයට පැමිණ සිටින මිනිසාට පාස්කුව යනු හුදෙක් ආගමික මංගල්‍යයක් නොව, ඔහුගේම ජීවිතයේ අභ්‍යන්තර පරිවර්තනයක කැඩපතකි. තරුණ වියේ තිබූ අසීමිත හඬායෑම් දැන් වගකීම් සහ අත්දැකීම් නමැති "කුරුසිය" මත තබා ඇණ ගසා තිබිය හැකිය. එහෙත් පාස්කු පණිවිඩය පවසන්නේ මේ සියලු බිඳවැටීම් මැද වුවද, සිදුවිය යුත්තේ "නැවත නැගිටීමක්" බවයි.

**01. පැරණි සෙවනැලි මිය යාම**

පරිණතභාවයට පත්වන විට අපට අපේම පැරණි ප්‍රතිරූපයන් මිය යාමට ඉඩ දීමට සිදුවේ. තාරුණ්‍යයේ තිබූ වේගය, අභිමානය සහ ඇතැම්විට අහංකාරය මෙහිදී කුරුස පත් වේ. වර්තමාන ශ්‍රී ලාංකේය මිනිසා ආර්ථික හා සමාජීය පීඩනය හමුවේ තම පෞද්ගලික සිහින මිය යනු බලා සිටින්නේ වේදනාවෙනි. නමුත් පාස්කුවේ ගැඹුරු අරුත නම්, යමක් මිය යාම යනු අලුත් දෙයකට ඉඩ ප්‍රස්තාව ලැබීම බවයි. ඔබේ තාරුණ්‍යයේ මිය යාම යනු ප්‍රඥාවේ උපතයි.

**02. සොහොන් ගැබ සහ අභ්‍යන්තර නිහඬතාව**

කුරුසියේ මරණයත් නැවත නැගිටීමත් අතර පවතින ඒ නිහඬ කාලය, පරිණත මිනිසා තම ජීවිතයේ අත්විඳින "ශූන්‍යත්වයට" සමානය. දරුවන් පියාපත් විහිදා ඉගිල යන විට, දෙමාපියන් වියපත් වන විට සහ රැකියාවේ ඒකාකාරී බව හමුවේ ඔබ තනි වූ බවක් දැනෙන්නට පුළුවන. එහෙත් සොහොන් ගැබ යනු විනාශය නොව, පරිවර්තනයක් සඳහා අවශ්‍ය නිහඬ ගර්භාෂයකි. තමාගේම වැරදි සහ අඩුපාඩුකම් දෙස උපේක්ෂාවෙන් බලා, සැබෑ මනුෂ්‍යත්වය හඳුනා ගැනීමට ලැබෙන්නේ මෙවන් හුදෙකලා මොහොතකදීය.

**03. නැවත නැගිටීම: මහිමාන්විත දෙවන උපත**

පාස්කුවේ සැබෑ ජයග්‍රහණය වන්නේ සොහොන් ගල පෙරළා දමා එළියට පැමිණීමයි. පරිණත මිනිසාට මෙය ගළපා ගත හැක්කේ තමා පෙළන බිය, සැකය සහ පසුතැවීම් නමැති සොහොන් ගල් පෙරළා දැමීමෙනි. වර්තමාන ලංකාවේ පවතින අඳුර මැද වුවද, අත්දැකීම්වලින් පරිපූර්ණ වූ ඔබ වැනි මිනිසුන් නැවත නැගිටිය යුත්තේ තාරුණ්‍යයේ වේගයෙන් නොව, පරිණතභාවයේ ස්ථාවරත්වයෙන් සහ කරුණාවෙනි.

නැවත නැගිටීම යනු පැරණි ජීවිතයටම යාම නොව, අලුත් මානයකින් ලෝකය දෙස බැලීමයි. ලාංකේය සන්දර්භය තුළ ඔබ කරන පරිත්‍යාගයන් අපතේ නොයන බවත්, ඒවා ආදරය නමැති ආලෝකයෙන් නැවත ජීවය ලබන බවත් පාස්කුව අපට පසක් කරයි.

මෙසේ...පරිණත මිනිසාගේ පාස්කුව යනු අළු මතින් නැගී සිටින ෆීනික්ස් පක්ෂියෙකු වැනිය. එය වෙහෙසකර බවින් මිදී, ආධ්‍යාත්මික නිදහස අත්පත් කර ගැනීමේ උත්සවයයි. ඔබේ ජීවිතයේ වසන්තය අවසන් වී නැත; එය වඩාත් සන්සුන් සහ ගැඹුරු ලෙස දැන් ආරම්භ වී ඇත.

# නිර්මාණ නොසිදුණු පැවිදි උල්පතෙන් මතු වූ සෝ ගීය



රූපස් ප්‍රැන්සිස් මයා

නිර්මල මරිය නිකායේ සිරිලක සුපිපි කුසුම අතිගරු මර්සලින් ජයකොඩි පියතුමාගේ නිර්මාණ දශක කීපයක් අන්තර්ගත කාල පරාසයකි. ගීතිකා, සිනමා ගී, නාට්‍ය ගී, අනුස්මරණ ගී, උපහාර ගී, කවි, ලිපි, යනාදියෙහි නියෝජනයකි. නත්තල, පාස්කුව, දේවස්ථාන මංගල්‍ය වෙසක්-පොසොන්, ජාතික හා ආගමික විශේෂිත උත්සව අරඹයා උන්වහන්සේගේ නව්‍ය නිර්මාණ තුළින් බැති බරව, ගෞරවාන්විත හා කෘතවේදීව හැඩ ගැන්වුණි.

කිතු උපතේ අසිරිය නිමාව දකිත්ම, නව වසරේ මුල් කාර්තුව ක්‍රිස්තු භක්තිකයිනට ජේසු සමිඳුන්ගේ ශුද්ධවූ කුරුසියේ ජීවිත පූජාවට දොම්නස්ව අනුගත වීමට සිදුවේ. ඒ දින හතළිහක වාම් පැවැත්මකට යොමු වීමෙනි. චතාරිකය නොහොත් කොරොස්මය එම දින වකවානුව හඳුන්වන නාමයක් වන අතර, පාස්කු ලෙස ප්‍රචලිතය.

එම දුක්ප්‍රාප්තියට යැදුමෙන් හා ගායනයෙන් හවුල්වන්නට උන්වහන්සේ "ළසෝ ගී" සොභාදහමට ලබැඳිව රචනා කොට, තනු නිමවා සමාජගත කර ඇත. "වාදනවේ දුර", "කුරුසේ නැග අත් විහිදා" "යහනක සේ මා" "සඳ පහනේ පිපි වැටකෙයා මලසේ" ජනතා සිත් සතන් තුල රැඳී පවතින නිර්මාණය.

යහනක සේ මා - පවි නෙත සැමා
කුරුසියෙහි මා - ගලවන සේ
ඔබ සැතපීලා - කඩිද බීලා
මට පණ දීලා - සනසන සේ

යනවද ජේසු - යනවද ජේසු
යනවද ජේසු - කුරුසියටා

කටු ඇති ඉරිලා - ඔබේ හිස කමලා
තොල් විහිදාලා - රුදු විලසේ
ඇස් පියවාලා - සුසුමෙන් තැවිලා
ලේ සිඳ හෙළලා - සිරි කුරුසේ

යනවද ජේසු - යනවද ජේසු
යනවද ජේසු - කුරුසියටා

අත් දිගු කරලා - අප පවි නොබලා
තුරුලට බඳලා - අප රැකලා
නිරය වසාලා - සැම ගලවලා
සග සෙත දීලා - පණ පුදලා

යනවද ජේසු - යනවද ජේසු
යනවද ජේසු - කුරුසියටා

තම හදවතෙහි කිතු සමිඳාණන් ගැන පහළ වන දැහැමි සිතුවිලි, පන්හිඳට නංවා ,ගොනුකොට ඊට රිසිවන තනු යොදා ප්‍රකාශයට පත් කිරීම සමිඳු දුක් ගායනාවේ සැබෑ යථාර්තය හුවා දැක්වීමකි.

පාදනමස්කාරයට, ගැඹුරු පැයට ගායනා කළ හැකි උන්වහන්සේගේ මෙවන් ගීතිකා ගයා දෙවරක් යැදීමට අප පොළඹනු ලැබීමකි.

මර්සලින් ජයකොඩි පිය හිමි සමිඳුනි,මෙවර පාස්කුවේදීත් අපි ඔබවහන්සේ ගැන ගෞරවයෙන් සිහිපත් කොට, මෙසේ ලියා තබමු.

# දුක්ප්‍රාප්ති ගීතිකාවේ මර්සලින් ජයකොඩි පිය ලකුණ

මහින්ද නාමල් ගුරු මහතා
කළුතර

ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය අළලා ලියැවුනු ගීතිකා සාමාන්‍යයෙන් හැඳින්වෙන්නේ පසම් හා ළතෝනි වශයෙනි. ළතෝනි හෙවත් විලාප ගී ශුද්ධ වූ බයිබලයේ පැරණි ගිවිසුමේ යෙසායා දිවැසිවරයාගේ පොත ගීතාවලිය ආදියේ සිටම දක්නට ලැබේ.

කිතුනුවන්ගේ චතාරික කාලය හෙවත් කොරොස්ම කාලය එනම් ජේසුස් වහන්සේගේ කුරුස පත්වීම සිදුවන මහ සිකුරාදා දිනට පෙර දින 40 ක කාලය තුළ වර්තමානයේ ගැයෙන 'පසම්' යනු ශ්‍රී ලංකාව තුළ ගැයෙන දුක්ප්‍රාප්ති ගීවලට පොදුවේ භාවිත වන නමයි. පසම් යන්න ඉංග්‍රීසි Passion යන වචනයෙන් හෝ 'PSALM' යන වචනයෙන් බිඳී ආවක් ලෙස සාමාන්‍යයෙන් සැලකේ.

ඇතැමුන් පසම් හා ළතෝනි අතරද වෙනසක් සළකුණු කරති. පසම් ජේසුස්වහන්සේගේ දුක්ප්‍රාප්තිය ගැන පොදුවේ ගැයෙන ගීතිකා ලෙසත් ළතෝනි විශේෂයෙන් දුක්ප්‍රාප්තියට අදාලව මරිය තුමියගේ වැලපීම් දක්වන ගීතිකා ලෙසත් ඔව්හු නිර්වචනය කරති. කෙසේ වෙතත් අප මෙහිදි පසම් 'හෙවත් 'දුක්ප්‍රාප්ති ගීතිකා' යන්න යොදන්නේ ඒ දෙවර්ගයම ආවරණය වන පරිදියි.

ශ්‍රී ලංකාවේ කිතුනු දුක්ප්‍රාප්ති ගීතිකාව අඩුම තරමින් පෘතුගීසි යුගය දක්වා ඈතට විහිදේ. පසුව ලන්දේසි යුගයේදී මෙරටට ආ ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා ලියූ දුක්ප්‍රාප්ති ගීතිකා අද දක්වා ඉතිරි වී තිබේ. 1728 දී එතුමා දුක්ප්‍රාප්ති ප්‍රසංගය නමින් ම ගද්‍ය කාව්‍යක් ලීවෝය. එතුමාට ලංකාවේ කිතුනු සාහිත්‍යයේ මෙන්ම දුක්ප්‍රාප්ති ගීතිකාද පීතෘභාවය පිරිනැමේ.

අප මෙහිදි සැකවින් විමසා බලන්නේ දුක්ප්‍රාප්ති ගීතිකාවට මර්සලින් ජයකොඩි (නි.ම.නි) පියතුමාගේ දායකත්වය ගැනයි. මර්සලින් ජයකොඩි පියතුමාගේ දුක්ප්‍රාප්ති ගීතිකා දායකත්වය ප්‍රධාන කොට ඇරඹෙන්නේ එතුමා ඓතිහාසික පාස්කු නාට්‍යයක් රඟ දැක්වූ මීගමු දුව ප්‍රදේශයේ මීසම් භාර පියතුමා ලෙස 1937 පැමිණීමත් සමඟය. එතුමා 1940 දක්වා එහි සේවය කළේය.

එතෙක් ප්‍රතිමා හෙවත් සුරුවම් ආධාරයෙන් රඟ දැක්වූ දුවේ පාස්කු නාට්‍යය නවීකරණයට එතුමා ක්‍රියා කළේය. 1839 දී ඇරඹී දුවේ පාස්කු නාට්‍යයට ඊට හරියටම වසර 100 කට පසු 1939 දී එතුමා ඩොර්ති සේයාර්ගේ රජෙකු වන්නට ඉපදුනු. (Born To Be a King) යන කෘතිය ඇසුරින් නව පිටපතක් සැකසූ අතර මිනිස් චරිතද ප්‍රථම වතාවට පාස්කු නාට්‍යය එක් කළේය. මෙතැනදි එතුමා තමන් විසින්



රචිත ගීතිකා කීපයක්ම මේ පාස්කු නාට්‍යයට එකතු කළේය. ඒවා ශ්‍රී ලංකාවේ දුක්ප්‍රාප්ති ගීතිකාවට සිදු කළ වටිනා සම්ප්‍රදායක් විය.

ඒ ගීතිකා කීපයක් ගැන ඉතා සැකවින් දැන් අපි විමසා බලමු.

වාදනවේ දුර වද බෙර රැව්දේ - නාද ඇසේ පිළි රැව් නැගෙනා
පාද නගා කල්වාරිය නගිනා - දෝත වඩා කුරුසය රැගෙනා

ජේසු අනේ ඔබ මේ විඳිනා දුක
සෑම අපේ පව් කරට ගෙනා
බෝ සොව්නා සිහිකර බැතිනා
අපි කඳුළු හෙලා හඬමු
අපි කඳුළු හෙළා හඬමු

පා ඔබගේ පෙම්බරිත සොබාවේ - දේව ගුණෙන් හදවත මුසුවූ
සෑම අමා රස පව්බර අපහට - ලෝක උපායට හිති අසුවූ

දෑස වසා හිස ලය මත හිඳුවා - දෑත තබා දෙදිගට ඇරලා
පාද නමා මරණය කර නංවා - බෝ දුකසේ ඔබේ පණ පිදුවා

මේ ගීතිකාව දුක්ප්‍රාප්ති ගීතිකාවකින් අතීතයේදි අපේක්ෂා කළ හැඟීම් මනාව ජනිත කරන අතරම පැරණි දේව ධර්මය එනම් ජේසු මැරුණේ අපේ පව්, බර කරට ගෙන අප උදෙසාය යන්නද මතු කෙරේ. 'යහනක විලසේ' නම් එතුමා ලියූ තවත් ජනප්‍රිය දුක්ප්‍රාප්ති ගීතය ද පෙර දැක්වූ ගීතයට සමාන්තරය.

යහනක විලසේ සැතපී සැපසේ
අප ගලවනසේ සිරි කුරුසේ
පණ පුද ලමිනේ අප සැම පෙමිනේ
පණගත් වමිනේ රැකලන සේ
යනවද ජේසු යනවද ජේසු යනවද ජේසු කුරුසියටා

දෙනුවන ඇරිලා කඳුළින් පිරිලා
සියොලඟ ඉරිද දුක් බරවී
සිරි පා නගලා දුර හෙළ බලලා
කුරුසය කරැලා මුව පරවී

අත් විහිදාලා හදට බදාලා
සැවොම මුදාලා දෙව් දරු සේ
මොක් සැප දීලා සෑම රස ලීලා
අප වෙත පාලා ගෙන කුරුසේ

ඉහත ගීතිකා දෙක මෙන්ම අදත් විශේෂයෙන් චතාරික කාලයේදීත් අවමගුල් පිළිවෙල්වලදීත් ගැයෙන ගීතිකාවකි. 'සෙවනැලි මත' ගීතිකාව

සෙවනැලි මත සෙවනැලි මත සෙවනැලි එන්නේ
ගඟ ගල ගල ගඟ ගල ගල පාවෙනු වැන්නේ
ඉහළට ගත් සුසුමට එන දුක කකි යන්නේ
පෙර සුසුමෙන් ආ දුකටයි නැත නව තින්නේ

සැපෙනු ද දුක දුකෙනු ද දුක නැත නවතින්නේ
දොරකින් දුරුවී ගොස් තව දොරකින් එන්නේ
ඇහි බඹ යට පොඩි පොඩි මිණි කැට බබලන්නේ
සිත යට මල් අතු දිගටම කටු මතුවන්නේ

ගැලුවද මහ මුහුදේ සිට එණු රස කඳුළු
මුහුදක් මැව්වද දෙව්දෝ ගන්නට කඳුළු
සත් මුහුදත් ඇතිදෝ රැක ගන්නට කඳුළු
ගලපන් කඳු ලැලි ගලපන් ගලපන් කඳුළු

දුක සනසන්නට ඇයි කඳුලට එණු කැව්වේ
ජීවිතයට පණ දෙන්නද මරණය මැව්වේ
ඇයි එළියයි සෙවනැල්ලයි එක තැන විව්වේ
ඉරණම ඇයි මානව ලෝකෙට දුක එව්වේ

ජීවිතයට රස කැව්වා ආදර බස් කිව්වා
මළවුන් නැතිටෙව්වා සත සෙත සැල සෙව්වා
ගිය තැන ගුණ වැව්වා පාපෙට ණය ගෙව්වා
ඉරණම ඔහු සෙව්වා මොහු මරවයි ලිව්වා

කඳු ගැටයක් සෙව්වා එය නගිමියි කිව්වා
කුරුසයකට යැව්වා වැටි වැටි මග ගෙව්වා
දස දුක රස කැව්වා දෑතට ගෙන බිව්වා
කුරුසේ සැතැපෙව්වා මට සිත් පැමිණෙව්වා

මර්සලින් ජයකොඩි පියතුමාගේ මෙම ගීතිකාව එතුමා ලියා ඇත්තේ ක්‍රිස්තු වර්ෂ 1970 දී දුවේ පාස්කු දර්ශනයේ ක්‍රිස්තු ප්‍රතිමාව කුරුසයෙන් බාන විට ගැයීම සඳහාය. එම ගීතය තුළ පාස්කු පණිවුඩයට අමතරව මර්සලින් ජයකොඩි පියතුමාගේ බොදුදුදහම හා සම්මිශ්‍ර වූ ජීවිත දර්ශනය අඩංගු වේ. බැලු බැල්මට එය පාස්කු ගීතයක් ලෙස හඳුනා

11 පිටුවට >>>

## දුක්ප්‍රාප්ති ගීතිකාවේ මර්සලින් ජයකොඩි පිය ලකුණ

10 පිටුවෙන් >>>

ගැනීම දුෂ්කරය. එහි පළමු ගී පංති දෙක තුළයි එතුමන් දුටු පාස්කු අරුත මතුවන්නේ. ඒ අරුත සම්ප්‍රදායික අරුතින් වෙනස් නොවෙයි. කල්වාරිය තමාට දෙව්ඳුන් පිං පැමිණ වූ තැන ලෙස එතුමා මේ ගීතිකාව තුල දකියි.

ජයකොඩි පියතුමා ලියූ තවත් ජනප්‍රිය නොවන දුක්ප්‍රාප්ති ගීතයක් මෙසේය.

කස පිරෙව්වා හිස කකියෙව්වා
හිසවට කටු බන්දා නින්දා කිව්වා
ඇණ බැණ රැව්වා දැළි දළ පිළී අත් දු
ලෙය දෙස බැලුවා දොතොලෙන් කිව්වා
මේ තගේ අනදරයයි
මා දෙස බැලුවා දෑසින් කිව්වා
මේ මගේ ආදර යයි
ජේසු ජේසු මා දෙස බැලුවා
දෑසින් කිව්වා
මේ මගේ ආදරයයි

ලතෝනි හා විලාප ගණයට අයත් එතුමා ලියූ පහත දැක්වෙන ගීතිකාව එතුමාගේ කෘතහස්ත භාෂා නිපුණතාවය විශාද කරන ගීතිකාවකි.

සඳ පහනේ පිපි වැටකෙයා මල සේ සුවඳ දිදී    තිබිලා
සඳ පහනේ පිපි මානෙල් මල සේ රුවට රුවේ    තිබිලා
සඳ පහනේ කිරි මුහුද වගේ අහෝ සුදට සුදේ    තිබිලා
ජේසු අනේ මේ කිම ද වුනේ ඔබේ මුහුණ ලෙයින්    වැසිලා

හිරු පහනේ පිපි රත්මල් වාගේ රතට රතේ    තැලිලා
හිරු පහනේ පිපි කටරොළු වාගේ නිලට නිලේ    තැලිලා
හිරු පහනේ පිපි මුරුත වගේ ඔබේ සිළුටු දෙතොල්    පැලිලා
ජේසු අනේ මේ කිම ද වුණේ ඔබේ මුහුණේ රතුයි    තැලිලා

ජයකොඩි පිය දුක්ප්‍රාප්ති ගීතාවලියේ තවත් සුවිශේෂි ගීතයක් වන්නේ විශේෂයෙන් ජේසුස් වහන්සේගේ මල් උයනේ අරගලය සිහි කරමින් කරන ශුද්ධ වූ පැය නම් භක්ති අභ්‍යාසය සඳහා භාවිත කිරිමට එතුමා රචිත 'මරිය මග්දලේනාගේ වැළපිල්ල' නම් පහත ගීතයයි.

රෑ මැද වෙලාවේ මා ඇස් පියන්නේ
මේ ගල්ලෙනේ දෝ මා හිස තබා
මා සිත සැලෙන්නේ ළා කොළ වගේ
ඇයි එය තැවෙන්නේ මේ දුක් බිමේ

ඇයි ඔබ නිදන්නේ මේ ගල්ලෙනේ
ඇයි හද තැවෙන්නේ මේ දුක් බිමේ

මේ කඳු බිමේ හා මේ මුළු ලොවේ
රෑ තරු පෙනෙන්නේ ලේ නෙත් වගෙයි
ලේ වැසි වසින්නේ පින්නක් වගේ
ඒ සිතයක් හෝ මේ දැන් රැයේ

දාරා හැලෙන්නේ කම්මුල් දිගේ
මන්දැයි නොදන්නේ මන්දැයි අනේ
මල් මාල වගේ රන් ගෙල වෙලා
දෑතින් ම මාගේ ගන්නත් සිතේ
නෑ සිත සැදෙන්නේ මේ දුක් රැයේ
කඳුළුයි හැලෙන්නේ මේ දුක් පැයේ
ඇයි නො නිදන්නේ තාපෙන් පිරි

මේ ගීතය ජේසුස් වහන්සේ සමඟ කුරුස පාමුල දක්වා ගමන් කළ මරිය මග්දලේනා නම් මුලදි පව්කාර ස්ත්‍රීයක ලෙස සැලකුණු පසුව කිතුනුවන් සාන්තුවරියක සේ සලකන මරිය මග්දලේනාගේ මුවින් ගැයෙනා ගීයක් ලෙස විරචිතයි. එය ජයකොඩි පියතුමාගේ පරිකල්පනය විශද කරන ගීතයකි.

අපට අනුව, අප ඉහතින් දැක්වූ ජයකොඩි පියතුමාගේ දුක්ප්‍රාප්ති ගීතවල මතුවන දේව ධර්මය කතෝලික සභාවේ පැරණි දේවධර්මය මතු කළද කිතු දහමේ විමුක්ති හරය හා සසඳා බලද්දී ඒ විමුක්ති හරය ඉස්මතු කරන්නේ ඉතා අල්ප වශයෙනි.

ජේසුස් වහන්සේම තම කල්වාරි ගමනේදී ජෙරුසලම් ස්ත්‍රීන්ට පවසන්නේ මා නිසා නොහඬන්න යනුවෙනි' එමගින් උන්වහන්සේ ස්ව අනුකම්පාව ප්‍රතික්ෂේප කළ බව පැවසේ. අනිත් අතින් ක්‍රිස්තු මරණයට හේතු වු ගැඹුරු යථාර්ථය අවබෝධ කර ගැනීමට හඬා වැටීම් වැලපීම් මගින් බාධා ඇතිවන බව උන්වහන්සේ අඟවයි. 'මා නිසා නොව ඔබත් ඔබේ දරුවන් නිසාත් හඬන්න' යන කියමන තුළ ඇත්තේ ඔවුන්ව සමාජ, ආර්ථික යතාර්ථය වෙත, සත්‍ය වෙත යොමු කිරිමේ ක්‍රිස්තු අභිලාෂයයි. ඒ නිසා,

ජේසු අනේ ඔබ මේ විඳිනා
සැම අපේ පව් කරට ගෙනා
බොහෝ සොවිනා සිහි කර බැතිනා
අපි කඳුළු හෙලා හඬමු

වැනි යෙදුම් වලින් විමුක්ති හරය අල්ලා ගැනීමට සහයක් ලැබෙන්නේ ඉතා මද වශයෙනි.

අපගේ මේ කෙටි විමසීම නිම කරන්නට අප තෝරාගත්තේ ජයකොඩි පිය දුක්ප්‍රාප්ති ගීතාවලියේ අප හිතන ආකාරයට විශිෂ්ඨතම අර්ථ පූර්ණ ගීතිකාව වන 'කුරුස නැග අත් විහිදා' ගීතිකාවයි.

කුරුසේ නැග අත්    විහිදා
මුළුලෝ තුරුලට    බදලා
සිටිනා දෙව් පුත්    රදුනේ
ඔබේ පා සිඹිමින්    වඳිමු

සිරසේ කිරුළේ    මිණිසේ
බැබලේ බිඳුවැල්    සිරිලේ
කුරුසේ සිටිනා    දෙව්දේ
ඔබේ පා සිඹිමින්    වඳිමු

දෙනෙතේ කඳුළුයි    ඔබගේ
දෙතොලේ ලේ වැල්    කැටිවේ
ඇණලා සිරවී    තිබෙනා
ඔබෙ පා සිඹිමින්    වඳිමු

පහරින් නිල් වු    සිරුරේ
දහරා ගලමින්    දිලිසේ
මෙලෙසේ පණදුන්    දෙව්දේ
ඔබේ පා සිඹිමින්    වඳිමු

සතුටින් ඔබ පණ    බිලිදී
පණ නේවා අප    කුරුසේ
නිරයෙන් අප සැම    ගැලවු
ඔබේ පා සිඹිමින්    වඳිමු

වරමින් ඔබ ඒ    කුරුසේ
අප පව් බැම්මෙන්    මුදවා
සැමදා රකිනා    සමිදේ
ඔබේ පා සිඹින්    වඳිමු

ඔබ හා කුරුසේ    නැගලා
ඔබේ දෑසින් ලොව    බලලා
ඔබ සේ කරුණා    පාලා
කුරුසේ හිඳිනා    සමිදේ

හිඳිනා ලෙස මා    කැඳවා
කල්වාරිය මත    නංවා
ඔබ හා මා හා    සිටිමු
කුරුසේ හිඳිනා    සමිදේ

මේ ගීතිකාව එතුමා රචනා කළේ දූවේ පාස්කු දර්ශනය දුටු මොහොතේ ඇති වු සිතුවිලි අනුව බව කියා තිබේ. කිතු තුමා මිය යන මොහොතේ සිදු කළේ කුමක්ද ? තම දෑත් විහිදා මුළු ලොවම තම තුරුලට බඳලා රඳවා තබා ගැනීමකැයි තමාට හැඟුනු බව ජයකොඩි පියතුමා පවසයි. මේ ගීතිකා තුළින් ජයකොඩි පියතුමා කිතුනුවන්ට ආයාචනා කරන්නේ ජේසුගේ මරණය ගැන හඬා වැටෙන්න වැළපෙන්න දුක්වෙන්න නොව ඒ ජීවිත පූජාව තුළින් මතු කරන ජීවිත මාර්ගයට පිවිස පුද්ගලිකවත් සාමුහිකවත් විමුක්තිය අත්කර ගන්න යන පණිවුඩයයි.

ඔබ හා කුරුසේ    නැගලා
ඔබේ දෑසින් ලොව    බලලා
ඔබේ සේ කරුණා    පාලා
කුරුසේ හිඳිනා    සමිදේ

චතාරිකය අපිට ආරාධනා කරන්නේ කුරුස පත්වු ජේසුගේ ඇසින් ලෝකය දෙස බලන්නයි. තමා දෙස බලන්නයි. එතුමාගේ දෑසින් බැලීම යනු ප්‍රේමයේ, සමාවදීමේ, යුක්තියේ සාධාරණත්වයේ දෑසින් බැලීමයි. ඒ බැල්ම සම්පූර්ණ වන්නේ එතුමා සේ අසල්වැසියාට, ලෝකයට ප්‍රේම කිරිම තුළයි. ජේසුස් වහන්සේ ලෝකය ගලවා ගන්නේ රුධිරයෙන් නොව ප්‍රේමයෙන් බව අප තේරුම්ගත යුතුය. ඒ කොන්දේසි විරහිත ප්‍රේමයෙන් ප්‍රේම කරමින් ප්‍රේමය මත පදනම් වු සමාජ ආර්ථික ක්‍රමයක් සහිත රාජ්‍යයක් සමාජයක් උදා කිරිමට කැපවීම නම් වූ එතෙරවීමට අප ඇතුලත් විය යුතුය.



# විමුක්තියේ ගමන මවන "පාස්කුව"

ශාස්ත්‍රපති
**කපිල ආසිරි සිල්වා**
ගුරු සේවය, සාන්ත පීතර විදුහල, කොළඹ 04.

ක්‍රිස්තියානීන්ගේ විශ්වාසයට අනුව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මොලොවට මනුෂ්‍ය වෙසින් වඩින්නෙ මිනිසුන්ගේ ගැලවීමේ මාර්ගය, එනම් විමුක්ති මාර්ගය උදාකරදීමටයි. උන්වහන්සේ එම කාර්යයේ නිරත වෙමින් සිටියදී රාජ්‍ය විරෝධී ද්‍රෝහියෙකු ලෙසින් නම් කර ජීවිතක්ෂයට පමුණුවනු ලබයි. උන්වහන්සේව මරණයට පත් කරන අවස්ථාව ඉතාම කෲරත්වයෙන් පිරුණු එනම්, සාමාන්‍ය මනුෂ්‍යයෙකුට දරා ගත නොහැකි තරම් වධ හිංසාවන්ට පමුණුවා අවසානයේ විශාල යකඩ ඇණ තුනක් මගින් කුරුසයට බැඳ ඇණ ගසා පණපිටින්ම මරා දමයි.

මෙම සිදුවීම ශ්‍රවණය කරන විටත් සිතට දැනෙනුයේ වේදනාකාරී, ශෝකී බවකි. එම ශෝකීභාවය තව තවත් තීව්‍ර වෙන්නෙ එම සිදුවීම් පෙළ මිනිසුන්ගේ දෙනෙත් ඉදිරියේ රූප ලෙසින් විද්‍යමාන වන්නට පටන් ගත් විටය.

මෙම සිදුවීම් මාලාව දේවධර්ම ශාස්ත්‍රයේ "පාස්කු අභිරහස" යනුවෙන් හැඳින්වේ. එනම් ජේසුස් වහන්සේ, උන්වහන්සේගේ දිවියේ අවසන් දෙතුන් දවස්වල අත්දුටු සිදුවීම් මාලාව මෙසේ විග්‍රහ වේ. ශ්‍රාවකයන් සමඟ අන්තිමට වැළඳු "පාස්කු භෝජනය" ඉන්පසු "ගෙත් සෙමෙනි උයන" ට ගොස් දෙවි පියාණන්ට දැඩි සිත් තැවුලින් ආයාචනය කළ ආකාරය , "ජුදස්" නැමති ශ්‍රාවකයා විසින් උන්වහන්සේව පාවා දීම, සිර බන්ධනය , යුදා පූජකයන් හා රෝම පාලකයන් ඉදිරිපිට විනිශ්චය කරනු ලැබීම, මරණ තීන්දුව ලැබීම, සෙබළුන්ගේ කෲර වධහිංසා, කුරුසය ඔසවාගෙනන යෑම, කුරුසයේ ඇණ ගැසීම, මරණය පරාජය කිරීම හෙවත් උත්ථානය යන සිදුවීම් මෙම "පාස්කු සිරිත" ට අයත් වේ.

ක්‍රිස්තියානි බයිබලයේ දෙවන කොටස වන "නව ගිවිසුම" නැමැති ග්‍රන්ථාවලියේ පළමු පොත් හතරේම මෙම "පාස්කු සිරිත" වාර්තා කර තිබේ. එහි සුවිශේෂීත්වය වන්නේ එහි නිරූපිත සිදුවීම් මාලාව යම්කිසි නාට්‍යානුසාරී බවක් ගැනීමයි. නාට්‍යක පවතින ප්‍රධාන ගැටුම හෙවත් ඝට්ටනය, මෙම සිදුවීම් මාලාව තුළින් ද මැනවින් නිරූපිතය. මෙවැනි ගැටුම් අවස්ථා වලින් ද සෙසු නාට්‍යමය අවස්ථාවලින් ද සුපෝෂිත වූ මෙම "පාස්කු සිරිත" ඇත්තෙන්ම "පාස්කු නාට්‍යයක්" වැන්නය. එම නිසා මෙම පාස්කු නාට්‍ය , පාස්කු රංගනය යැයි පැවසීමේ දොසක් නැත.

මුල් කාලයේදී පාස්කු නාට්‍යය රඟ දක්වා තිබෙන්නේ රූකඩවල මාර්ගයෙනි. ඉතාම ඉපැරණි රූකඩ පාස්කු රංගනයන් මන්නාරම් පළාතේ "පේසාලෙ" නම් ග්‍රාමයේ අවුරුදු තුන් හාරසීයකට පෙර පටන්ගෙන තිබූ බවට පැවසේ. ඉන් පසු ක්‍රමක්‍රමයෙන් එය වර්ධනය වී රූකඩ සුරුවම් වෙනුවට සැබෑ මිනිසුන් යොදාගෙන මෙම පාස්කු නාට්‍ය රංගනය සිදුකර තිබේ.

### පාස්කු රංගනයට ඉදිකළ පාස්කු මඩුව

පාස්කු රංගනය ඉදිරිපත් කිරීම සඳහා එයටම අනන්‍ය වූ ස්ථානයක් නිර්මාණය කරන්නට යෙදුණු බවට සාක්ෂි පවතී. කතෝලික දෙව් මැදුරේ පසෙකින් මෙම මඩුවක ආකාරයේ ගොඩනැගිල්ල දැකිය හැකි විය.

"අවුරුදු හැත්තෑවක් හෝ අසූවක් මුළුල්ලෙහි සම්ප්‍රදායානුකූලව පාස්කු නාට්‍ය රඟ දක්වාගෙන යන පිටිපන නම් ගමෙහි මේ සඳහා තනන ලද විශේෂ පාස්කු මඩුවක් දෙව් මැදුර ඉදිරියෙහි තිබේ. ගඩොල්වලින් හා සිමෙන්තියෙන් බිත්ති සාදා උළු සෙවිලි කොට තනා ඇති ස්ථාවර ගොඩනැගිල්ලක් වන මේ පාස්කු මඩුව උස් වූ මැද ගබඩාවකින් ද දෙපසෙහි පිහිටි මඳක් කුඩා වූ ගබඩා දෙකෙකින් ද යුක්තය."

සිංහල ගැමි නාටකය
මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර (පිටුව - 175 )

මෙවැනි ස්ථාවර ලෙස නිර්මාණය කළ පාස්කු මඩු අදටත් මීගමුව, පමුණුගම, හලාවත වැනි ප්‍රදේශවල කතෝලික දෙව් මැදුරු තුළ දැකිය හැකි වෙයි.

### පාස්කු නාට්‍යයේ ඇති ජීවමාන ගුණය

පාස්කු නාට්‍ය තුළ නිරූපණය වන්නේ එකමත් එක රටක, එකමත් එක කලක ජීවත් වූ එක්තරා පුද්ගලයකුට සිදුවූ පුරාණ කතාවක් නොව, එය සර්වකාලීනව සෑම විටම අත්විඳීමට හැකි වන පණිවිඩයකි. එම පාස්කු සිරිත තුළ "එතුමා මැරුණේ කෙසේද ?" යන්නට වඩා "එතුමා මරා දැමුවේ මන්ද ?" යන සිදුවීම නිරූපණයට උත්සාහ ගනී. ජේසුතුමන් පෙනී සිටියේ 'ප්‍රේමයේ' පාර්ශවයේ ය. රෝම අධිරාජයන් පෙනී සිටියේ 'බලයේ' පාර්ශවයේ ය. ප්‍රේමය හා බලය අතර පවතින සදාතනික ගැටුම මෙම පාස්කු සිරිත තුළින් ද එලෙසම නිරූපණය වූ සත්‍යයකි. එම නිසා මෙම පාස්කු රංගනය නරඹන ප්‍රේක්ෂකයාට ද එහි කිසිදු අභව්‍යත්වයකින් තොරව විඳගැනීමේ අවකාශය ලැබේ. එය එම රංග කාර්යයේ ඇති සුවිශේෂී ජීවමාන ගුණයකි.

මුල් කාලයේ සුරුවම් මගින් සිදුකළ මෙම පාස්කු රංගනයන් පසුව ජීවමාන මිනිසුන් මගින් නිර්මාණය කරන්නට වීම තවදුරටත් එහි ජීවමාන ගුණය ඉස්මතු වී පෙනෙන්නකි. 'යාපනය' ප්‍රදේශයේ ද බොහෝ ඈතට විහිදුණු පාස්කු රංගනයක් තිබුණු බවට සඳහන් වේ. කෙසේ වෙතත් 'බොරලැස්ස' ප්‍රදේශයේ පාස්කු රංගනය ඉතාම සජීවී ස්වරූපයක් ගත් ඉපැරණි රංගනයක් වශයෙන් සැලකේ.

ක්‍රි.ව 1633 දී පමණ ජර්මනියේ 'ඔබර් අමගව්' ග්‍රාමයේ සිදු වූ හාරයක් නිසා පාස්කු දර්ශනයක් පවත්වා තිබේ. මෙම පාස්කු දර්ශනය ලොව පූජනීයම හා දර්ශනීයම පාස්කු රංගනය වශයෙන් ලොව ප්‍රචලිත වන්නට විය. මෙම පාස්කු රංගනයක් නැරඹීමට අවස්ථාව උදා

13 පිටුවට >>>

**විමුක්තියේ ගමන මවන "පාස්කුව"** 12 පිටුවෙන් >>>

වූ ශ්‍රී ලාංකිකයෙකු වූ 'ලොරන්ස් පෙරේරා' එහි ආභාසය ලබා ගෙන 1924 දී බොරලැස්ස ප්‍රදේශයේ පාස්කු දර්ශනයක් නිමවන ලදි. මෙය පූර්වාදර්ශයට ගෙන මීගමුව, දූව, පිටිපන, වත්තල, හලාවත, පයාගල වැනි ප්‍රදේශවලදී ඉතාම දර්ශනීය ලෙස පාස්කු රංගනයන් නිර්මාණය කළ අන්දමක් දැකගතැකි විය.

සෑම තැනකම පාහේ පාස්කු නාට්‍ය ඇරඹෙන්නේ ගොබි ඉරිදා / ගොප් ඉරිදා වකය. උදෑසන දිව්‍ය පූජාවෙන් පසුව ජේසුස් වහන්සේ කොටළුවෙකු පිට නැගී ජෙරුසලමට වැඩිය ආකාරය පෙරහරකින් නිරූපණය කරනු ලැබේ. මේවාට ග්‍රාම වාසී ජනතාවක් ඉතාම භක්තියෙන් යුතුව සජීවීව සම්බන්ධ වූහ. මහසිකුරාදා පස්වරුවේ යළි ආරම්භ කරන නාට්‍ය ජවනිකා වල බොහෝ විට මුලින්ම දැකගැනීමට ලැබෙන්නේ ජේසුස් වහන්සේ කුරුසය කර තබාගෙන යන ආකාරයයි. මේ යන අතර 'වෙරෝනිකා' නම් ස්ත්‍රිය විත් ලේන්සුවකින් උන්වහන්සේගේ මුහුණ පිස දැමූ ආකාරයත්, එවිට එම ලේන්සුවට උන්වහන්සේගේ මුහුණු සටහන ඇඳුන ආකාරයත් නිරූපණය වේ. දේව මෑණියන් පැමිණ ජේසුගේ කුරුසය ඔසවාගෙන යාමට උදව් වෙන ආකාරය තවත් බොහෝ සිදුවීම් ද ප්‍රේක්ෂක සිත් ආකර්ෂණය කර ගත හැකි ලෙස සජීවීව නිර්මාණය වේ. අවසානයේ දෙපස සොරුන් දෙදෙනාට මැදිව කුරුසියට පත් වී සිටින ජේසුස් තුමාගේ දර්ශනය සියලු ප්‍රේක්ෂකයන්ගේ හදවත් ශෝකයෙන් පුරවයි. මෙම සිදුවීම් මාලාව සිතට දුකක්, නෙතට කඳුළක් මතු කරවීමට සමත්ය. එනම් ට්‍රැජඩි ස්වරූපයේ නාට්‍යක ලක්ෂණ මෙම පාස්කු රංගනය තුළ සජීවීව ප්‍රතියමාන වේ.

**මීගමුව, දූව පාස්කු රංගනය**

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල රඟ දක්වනු ලබන පාස්කු දුඃඛප්‍රාප්ති රංගනයන් අතර මීගමුව, දූව ප්‍රදේශයේ පාරම්පරිකව පැවත එන පාස්කු රංගනය කැපී පෙනෙන එකකි.

"මීගමු වෙරළට නුදුරින් පිහිටි දූව නම් වූ කුඩා දූපතේ සෑම තුන් අවුරුද්දකටම දෙවරක් බැගින් රඟ දැක්වූ පාස්කු නාට්‍යය මේවා අතර ඉතා පැරණි නාට්‍යය ලෙස ප්‍රසිද්ධියට පත්විය. දූවේ පාස්කු නාට්‍යය දෙවරක් පිට පිටම දූපතෙහි රඟ දක්වා අනික් අවුරුද්දෙහි මීගමුවේ සාන්ත පීතර දේවස්ථානයෙහි රඟ දක්වුණු ලැබේ."

සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර (පිටුව 176)

මුල් කාලයේදී සුරුවම් නාට්‍ය සම්ප්‍රදාය මෙම ප්‍රදේශයේ පැවතුනත් පසුකාලීනව සැබෑ මිනිසුන්ගේ රංගනයෙන් පෝෂිත වූ පාස්කු නාට්‍ය කලාවක් මීගමුව දූවේ ස්ථාපිත වී පවතී. බෝට්ටු මගින් ධීවර කටයුතු සිදුකළ පිරිසට ඉන්දියාවේ කොචින් ප්‍රදේශයේ එක්තරා දක්ෂ ප්‍රතිමා ශිල්පියෙකු විසින් නිර්මාණය කර දුන් ක්‍රිස්තු ප්‍රතිමාවක් මෙම මුල් කාලයේ පාස්කු රංගනයට යොදාගෙන ඇත. අදටත් එම ආශ්චර්යමත් දේව ප්‍රතිමාව සුරැකිව පවතී.

මීගමුව කුට්ටිදූව සිට පාස්කු දුව දක්වා සකස් කර තිබූ දැවමය පාලම ඔස්සේ "ජාකෝමේ ගොන්සාල්වෙස්" පියතුමා දූවට පැමිණි බව සඳහන් වේ. එතුමා විසින් රචිත 'දුඃඛප්‍රාප්ති ප්‍රසංගය' හා 'දේශනා නවයේ පසන් පොත' ඇසුරු කර ගනිමින් මුල් කාලයේ දුව පාස්කුව නිර්මාණය වී තිබූ බවට විශ්වාස කෙරේ.

මෙසේ දිගු කාලයක් සුරුවම් ආශ්‍රිතව පැවතුණු මේ දුඃඛප්‍රාප්ති රංගනය 1939 පමණ කාලයේ දුව මීසම්භාර පියතුමා වශයෙන් ගරු 'මර්සලින් ජයකොඩි පියතුමා' අතින් යම් යම් වෙනස්කම් වලට භාජනය වන්නට විය. ලෝක ප්‍රසිද්ධ ලේඛිකාවක වූ 'ඩොරති සේයර්ස්' විසින් රචිත Born To Be King නම් වූ ක්‍රිස්තු චරිතාපදානය මූලාශ්‍ර කරගනිමින් ජයකොඩි පියතුමා සිංහල බසින් නව පාස්කු රංග පිටපතක් සකස් කරන ලදි. වර්තමානයේ දී පවා යොදාග නු ලබන්නේ එම මූලික පාස්කු පිටපතම වීම සුවිශේෂය.

දූවේ පාස්කු රංගනය සඳහා සකස් කළ 'පාස්කු මඩුව' ස්ථාවර මඩුවක් නොවේ. එහි ප්‍රධාන මණ්ඩපයට දෙපසින් තවත් කුඩා මණ්ඩප දෙකක් සකස් කරයි. ඒ සියල්ලම විවිධ ජවනිකා රඟ දැක්වීමට යොදා ගැනේ. මුල් කාලයේ පාස්කු රංගනය සඳහා ස්ත්‍රී චරිත නිරූපණය සිදු කර තිබුණේ ස්ත්‍රීන් ලෙස රංගනයේ යෙදිය හැකි පුරුෂයන් විසින් ය. එහෙත් මෑත භාගය වන විට ස්ත්‍රී චරිත ස්ත්‍රීන් විසින්ම රඟ දක්වනු ලබයි.

දුවේ පාස්කු රංගනයේ සුවිශේෂීත්වයක් වන්නේ කුරුසයේ ඇණ ගැසීමේ ජවනිකාව සඳහා ජේසුතුමාගේ චරිතය නිරූපණය කරන ජීවමාන රංගන ශිල්පියා වෙනුවට ආශ්චර්යමත් ක්‍රිස්තු ප්‍රතිමාව යොදා ගැනීමයි. එය අතීතයේ පටන් නොනැසී පවතින්නා වූ සම්ප්‍රදායකි.

කෙසේ වෙතත් සමස්ත ලෝක සත්ත්වයාට ගැලවීමේ මාර්ගය දේශනා කිරීමේ අටියෙන් පැමිණි ජේසුතුමන් සිය අවසන් ගමන යන අවස්ථාව කතෝලික ප්‍රජාව විශ්වාස කරනුයේ 'විමුක්තියේ ගමනක්' ලෙසය. එම නිසා සෑම කතෝලික භක්තිකයෙකුම සිය සිරුර මත ජේසුගේ අවසන් ගමන ගිය කුරුසේ සලකුණු ඇඳගනී. පෙරදිග නාට්‍ය කලාව පෝෂණය උදෙසා මෙම පාස්කු රංගනය තුළින් ලැබුණු පිටුවහල පිළිබඳව කොතෙකුත් වාර්තා වී තිබේ. එම නිසා මෙම පාස්කු රංගනය හුදෙක්ම එක්තරා රටක හෝ එක්තරා ජන කොටසකට පමණක් සීමා වූවක් නොවන බව ඒකාන්තයෙන්ම කිව හැකිය.

# ජේසුනි.....!

කටු කිරුළක් හිස මත රඳවා ගෙන
බට දණ්ඩක් ජය කොන්තය ලෙස ගෙන
රතු සළුවක් ගත වට දවටා ගෙන
රජ දහනක් ගොඩ නැගුවේ ඒ දින


අන්නස් හමුවේ ඔබ විනිසුරු විය
කයිපස් විත්තියෙ චූදිතය සරි විය
සියවස් ගණනක නිල බල සුන් විය
හැමදොස් සමිඳුගෙ වචනින් සුළු විය


කස පහරින් රතු රටා පුරා ගෙන
විස වදනින් අවමන් හැම විඳ ගෙන
රස කරමින් රුපු සිත් තුටු කර මින
දස රිදුමන් මැද පා යුග ගෙව මින

කඳු ගැටයක් නැග ලේ ඩා වැගිරී
කුරුසිය මත නිදි යහනක් ඇතිරී
දිවි සැරියේ අවසන ගැන මැතිරී
කුරුසියෙ මහිමය දස දෙස පැතිරී

ඔබමය සමිඳුන් මනු සිත් නැළ වූ
පාපය සිඳ බිඳ හදවත් කියැ වූ
මරණය පරදා යළි ලොව බිහි වූ
සාමය ප්‍රේමය සැම තැන පිර වූ

**කැතරින් ගුණවර්ධන**
නාත්තන්ඩිය





# සිත් පෙරළියෙන් ජීවනයට එතෙරවෙමු

**ලූෂන් එඩ්වඩ් පෙරේරා**
ගෝනවල.

**ස්වාමිවරුන් දෙදෙනෙකුට මෙහෙවර කිරීමට කිසිවෙකුට නුපුළුවන. මන් ද, ඔහු කෙනෙකුට වෛර බැඳ අනිත් අයට ප්‍රේම වන්නේ ය. නැතහොත් එක් කෙනෙකුට ලැදි වී. අනිත් අය හෙළා දක්නේ ය.**

ජේසුස් වහන්සේ ගේ කටුක දුක් ගාවීනා විදිම, සාගතය, හා තේජාන්විත උත්ථානය සිහිපත් කරන ඉතා වටිනා පාස්කු සමයකට අපි අවතීර්ණ වී සිටින්නෙමු. මේ සමයේ මූලික තේමාව වනුයේ, "මනස්ථාපනය" හා "එතෙර වීම" පිළිබඳවයි.

ජේසුස් වහන්සේ කල්වාරියේ කුරුස ගසේ දි උන්වහන්සේ ගේ ශ්‍රී රුධිරය හෙළා කල ජීවිත පූජාව තුළින් අපගේ පාපයේ මිලය ගෙවා අවසානය. පෙර සිටි, දැන් සිටින, මතු සිටින්නට යන, සියලු පරම්පරාවන්ගේ ගැළවීම උදෙසා උන්වහන්සේ තම ජීවිතය පූජා කර අවසානය.

සැබෑ මනස්ථාපනය යනු ලී කුරුස කර තබාගෙන අව්වේ වේලි හඬමින් පාද නමස්කාරය යෑමත්, පල්ලියේ කුරුස ගස දෙස බලා කඳුළු සලමින් පපුවට ගසා ගැනිම පමණක් නොව, සියලු වත් පිළිවෙත් වලට එහා ගිය තම තමාගේ පාපකාරී අධාර්මික ජීවිත ක්‍රමයෙන් ඉවත් වී, යුක්ති ගරුක, සාධාරණ, ප්‍රේමයේ ජීවිතයකට පියවර තැබීමයි. එය ශුද්ධාත්මයාණන් වහන්සේ ගේ ස්පර්ශය තුළ ක්ෂණයකින් සිදුවන්නකි.

මරණ දඬුවමට වරදකරුවන් වූ තවත් දෙදෙනෙක් ද උන්වහන්සේ සමඟ ගෙන යන ලදහ. ඔවුහු කපාලපිටිය නම් ස්ථානයට පැමිණ, එහි දී උන්වහන්සේ කුරුසයෙ හි ඇණ ගැසුහ. වරදකරුවන්ගෙන් එක් කෙනෙකු උන්වහන්සේ ගේ දකුණු පස ද, අනික් එක්කෙනා වම් පස ද, කුරුසිවල ඇණ ගැසුහ. (ශු.ලූක් 23: 32 - 33) යනුවෙන් සඳහන් ය. එමෙන් ම, "එල්ලා සිටි වරදකරුවන්ගේන් එක් කෙනෙක් උන්වහන්සේ ට අපහාස කරමින්, ඔබ ක්‍රිස්තුස් නොවේ ද? ඔබවත් ගලවාගෙන අප වත් ගලවා ගන්නැයි කීය. අනෙකා ඔහුට තරවටු කරමින්, එම දඬුවමට පැමිණ සිටින ඔබ දෙවියන් වහන්සේටවත් බිය නැද්ද? අපට දඬුවම් ලැබීම සාධාරණය. අපට මේ ලැබෙන්නේ අපේ ක්‍රියාවලට සුදුසු විපාක හැටියට ය. එහෙත් මේ තැනැත්තා කිසිම වරදක් කර නැතැ යි උත්තර දුන්නේ ය. තව ද ඔහු" ජේසුස් වහන්ස, ඔබ රාජශ්‍රියෙන් වඩිනා කල මා සිහිකල මැනවැ යි කීය. උන්වහන්සේ ද කථා කරමින් "ඇත්තෙන්ම මම ඔබට කියමි, ඔබ මා සමඟ අද ම පාරාදීසියෙ හි සිටින්නෙහි යයි වදාළ සේක." (ශු.ලූක් 23:39-43) යනුවෙන් ශු.ලියවිල්ලෙහි සඳහන් වේ.

බලන්න මේ දෙදෙනා ගේ අධ්‍යාත්මයේ වෙනස මොන තරම් පුදුමාකාරද කියා. එක් කෙනෙකු ඉතාම පහත් විදිහට තමාගේ මරණ මොහොතේත් ජේසුට අපහාස කරන හැටි. ඔහුගේ උඩඟු, උද්දච්ච, අහංකාර, අධාර්මික, ගති මානසික ස්වභාවය නිසා ගැලවීම ලබා ගැනිමට ඔහුට වාසනාව, පින, නැති විය. එහෙත් අනෙක් තැනැත්තා ඉතාම නිහතමානිව, බැහැපත්ව, තමන් ගේ වැරදි පව්කාරකම් ඒ මරණ මොහොතේ පිළිගෙන ක්ෂණයකින් ජේසුව අදහාගෙන උන්වහන්සේගේන් ගැළවීම ඉල්ලා යාච්ඤා කළේ ය. ජේසු ඒ අවසාන මොහොතේ ඔහුට ප්‍රකාශ කලේ තනියෙන් නොව ඔබට අද මා සමඟ ම පාරාදීසයට යා හැකි බවයි.

සමහරවිට එම තැනැත්තා කිසිදාක පල්ලි නොගිය, දෙවියන් ට යාච්ඤා නොකල, උන්වහන්සේ ව විශ්වාස නොකල දරුණු පව්කාරයකු මෙන් ම ඇති. එහෙත් ඔහු තම මරණ මංචකයේ දි ජේසුව විශ්වාස කර ක්ෂණික මනස්ථාපනයකින් (සිත් පෙරළියට) ඊළඟ ජීවිතය සුගතියට පත්කර ගත් ආකාරය අප මෙම පාස්කුව තුලවත් අවබෝධ කර ගන්නේනම් එයට සැබෑ සිත් පෙරළියක් වනු ඇත.

එමෙන් ම, එතෙර වීම යනු, සියලු තෘෂ්ණාවෙන් නිදහස් වී සිත හෙවත් මනස ශුද්ධත්වයට පැමිණ විමයි. "එතෙර විම" යන්න අද අප විසින් වචනයකට පමණක් සීමා කර ඇතැයි අපට හැඟේ. ධනය තියෙන අය මොන තරම් තව තවත් ධනය රැස් කරන්නට මහන්සි වෙනවා නොවේ ද?. සමහරවිට මේ පෙළොවේ මනුෂ්‍යා දිවි ගෙවන කාලය අවුරුදු හැට හැත්තෑවයි. මරණයට වයස, තත්ත්වය, තරාතිරම් ප්‍රශ්නයක් නොවන බව අපි කවුරුත් දනිමු. එසේ නම් මරණයට කලින් අප සිත් පෙරළිය ඇති කර ගත යුතු ය. සමහර විට ගිය පාස්කුවේ අප සමඟ සිටි අප ගේ නෑදෑ හිතවතුන් බොහොමයක් මේ පාස්කුවට කලින් ලෝකය අතහැර ගිහින් ඇති. එම නිසා මෙම සිත් පෙරළියට අපත් ප්‍රමාද නොවිය යුතුය.


"ස්වාමිවරුන් දෙදෙනෙකුට මෙහෙවර කිරීමට කිසිවෙකුට නුපුළුවන. මන් ද, ඔහු කෙනෙකුට වෛර බැඳ අනිත් අයට ප්‍රේම වන්නේ ය. නැතහොත් එක් කෙනෙකුට ලැදි වී. අනිත් අය හෙළා දක්නේ ය. දෙවියන් වහන්සේට සහ වස්තුවට සේවය කරන්නට ඔබට නොහැකි ය." (ශු.මතෙව් 6: 24) යනුවෙන් ජේසුස් වහන්සේ ශුද්ධ ලියවිල්ල හරහා අපට ප්‍රකාශ කරන සේක. එබැවින් මෙම පාස්කුවේ දි අප සිත් වල පැල පදියම් වී ඇති සියලු ආකාර වෛර, ක්‍රෝධ. උඩගුව, මාන්නය, තණ්හාව, ඊර්ෂ්‍යාව, අනුන් හෙළා දැකිම, ආදි දුර්ගුණ ක්ලේෂයන්ගෙන් මිදී ශුද්ධෝත්මයාණන් වහන්සේ ගේ මඟ පෙන්වීම තුළ උත්ථාන වූ ජේසුස් වහන්සේ ව අත් දකිමු.



# ආදරය

**චම්පිකා එදිරිසිංහ**
හේවාදිවෙල

පසුතැවිලි වීම සහ වෙනස් වීම තුළින් අපව නව ජීවිතයකට යොමු කරන කාලය චතාරිකය වේ. මෙම නව ජීවිතයට අපව කැඳවා ගෙන යාමට උපකාරී වන සහ දෙවියන් වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයකට ආධාර කරන මඟ පෙන්වීම් තුනකි. එය චතාරික කුළුණු තුන නම් වේ.




කතෝලිකයන් ලෙස අපගේ ජීවිත වෙනසකට යන නව ජීවිතයකට කැඳවා ගෙන යන්නේ ක්‍රිස්තුන් වහන්සේ ගේ ආදරයයි. උන්වහන්සෙගේ ආදරය නිසා දෙවිඳුන් තුළ අපගේ ජීවිතය අලුත් කිරීමට හැකියාවක් මෙම කාලය තුලදී අපට හිමිවන බව අප විශ්වාස කළ යුතුය.

දින 40 කාලයක් අපි ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය සහ මරණය හරහා ගමන් කිරීමටත් උන්වහන්සේ ගේ මරණය තුළින් නැවත නැඟිටීම ගැන ප්‍රීති වීමටත් මඟ පාදයි. අපගේ සක්‍රමේන්තු ජීවිතයේ සාරය උකහා ගැනීමට නම්

**අපි යාඥාවෙන් දෙවිඳුන්ට ආදරය දක්වමු.**

යාඥව තුළින් අපට නිරාහාරව සිටීමට ශක්තිය ලබා දෙයි. දෙවිඳුන් සමඟ සමීප සම්බන්ධතාවයක් ගොඩ නඟා ගැනීමටත් චතාරිකය තුළ ශුද්ධවන්ත වීමටත් අපට ලැබී ඇති ආශිර්වාදයකි. යාඥාව; නිහඬ භාවනාවකින් සහ භක්තියකින් මෙම දින 40 කින් අප දෙවිඳුන් යදිමු. (යාඥාව සඳහා ශුද්ධ ලියවිලි පාඨ එනම්; ශෙපනියා 3:17 ජොයෙල් 2:1-2 ජොහාන් 16:33

අප ගෙවන්නා වු සෑම තත්පරයක් ම සහ ක්‍රියාවක්ම යාඥාවෙන් ආරම්භ කිරීමට අධිෂ්ඨාන කර ගනිමු. එමගින් අපිට දේව ආදරය අත්දකින්නට හැකි වනු ඇත. පැරණි සම්ප්‍රදායක් වන නිරාහාරව සිටීම සහ වැළකී සිටීම ක්‍රිස්තියානි ඉතිහාසයේ සහ මුල් චතාරික පිලිවෙතෙහි පැරණි සම්ප්‍රදායන් වේ.

**උපවාසයන් තුලින් කල යුත්තේ කුමක් ද ?**

සැබැවින් ම උපවාසය අපට අඩුවක් කරන්නේ නම් සහ එහි යහපත් ප්‍රතිඵලයක් ලෙස වෙනත් කෙනෙකුට ප්‍රතිලාභ ලබා දෙන්නේ නම් උපවාසය අර්ථවත් බව ප්‍රාන්සිස් පාප් වහන්සේ අපට මතක් කර දෙයි.

එදිනෙදා ජීවිතයේ දී අපි උපවාස කල යුතු නැත්තම් වැළකී සිටිය යුතු වන්නේ කුමකින් ද? කියා සිතමු. සාම්ප්‍රදායික ක්‍රම වලට අමතරව සමාජ මාධ්‍ය, තාක්ෂණය, ඕපදූප, ඊර්ෂ්‍යාව, තෘෂ්ණාව, වෛරය, කෑදරකම, ආදී සමාජ ව්‍යවසනයන්ගෙන් අපි උපවාස වෙමු. එයින් අපි අපිටම ආදරය කරන්නට සිත් යොමු කරමු. (නිරාහාර ව සිටීම සඳහා ශුද්ධ ලියවිලි පාඨ, ජොයෙල් 2:12-14 යෙසයා 58:6-7 මතෙව් 6:16-18

දෙවියන් වහන්සේ අපට දී ඇති සියල්ල සඳහා අපගේ කෘතගුණ සැලකීමට හැකිවන එකම මාර්ගය දාන දීමයි. අපි දන් දිය යුත්තේ මොනවාද? ආහාර පාන ලබා දීම පමණක් නොව අප තුල ඇති ප්‍රේමය, දයාව, දැනුම, හැකියාවන් ආදී දීමනාවන් ද පුණ්‍ය කටයුතු ලෙස දීම මඟින් අන් අයට ආදරය ලබා දීමට හැකිවනු බව අපි තරයේ සිතට ගනිමු.

(දාන දීම සඳහා ශුද්ධ ලියවිලි පාඨ ලෙවී කථාව 19:9-10 හිතෝපදේශ 19:17 ලූක් 19:10 රෝම 15:25-28)

අප ඉදිරියේ ඇති දින 40 ක චතාරික කාලය තුල

යාඥාවෙන් අපි දෙවිඳුන්ට ආදරය කරමු.

උපවාසයෙන් අපි දෙවිඳුන්ට ආදරය කරමු.

දන්දීමෙන් අපි දෙවිඳුන්ට ආදරය කරමු.

# ඇණ ගැසුණු හදවතක්...

**පී. ක්‍රිස්ටීන් නිසංසලා ජයරත්න**
ශු.ජපමාල රාජේශ්වරියගේ දෙව් මැදුර, හේවාදිවෙල.

පරවගිය නෙක බිගුන් රොන්ගත්...
සුවඳ වනමල් පිරි එ මල් උයන ...
නිහඬ සඳරැස් දිස්නයක් දෙයි...
පොළව තෙමන දහ බිඳට ලේ මුසුව...
නිසල අඳුරත් බිඳ නැගෙයි ඒ හඬ...
බර වූ හදවතින් මිහිමතට ...
කුමක් හෝ නැගෙයි ලය තුළ ...
නිවසෙ හුන් මරි මව්ගෙ නිහඬව...
පියාගති ඈ සිරකරන් නෙත් යුග...
ඒ මොහොත ඇත ලඟ ලඟම දැන...
විවර කළ ඈ දෙනෙත් හනිකට...
නිවස වෙත ආ පිටස්තරයෙකුට...
රැගෙන ගිය බව දැන පුතුන් සමඟ සෙබළුන් ...
දිවගියේ දකිනට පුතුන් තම...
ගල් ගැසුණු හදවතත් රැගෙනම ...
නෙක චෝදනා පැටවෙයි පුතුන් මත ...
නෙත් ගැටෙනවිට ඔවුන් එකිනෙක...
ඒ මොහොත දැන් පැමිණ ඇත...
දිරිය දෙයි මවුන් නෙත් පුතු හදට...
හදෙහි හෝ මුවෙහි නොනැගිනි...
විලාපයන් දෙව් වෙතට ඈගෙන්...
පොළව තෙතවන බවක් දකිති ඈ...
නිදොස් රුධිරෙන් පුතුගෙ සිරුරින් ...
නැත ගලන්නට දෙනෙතෙ කඳුළැල්...
මුහුකරන්නට පුතුගෙ රුහිරෙට...
වියැළි ගොස් ඇත ඇගේ නෙත් යුග...
බිඳී ගිය ඒ හදෙහි රස්නෙට...
කුරුසියක් කර තබායන බව...
දකී ඈ පුතු මොහොතකින් තව...
හැකි නම් මට ලබා ගන්නට...
මගෙ පුතේ එය මාගෙ කරපිට...
දහසකුත් සිතුවිලි ගඟකි ඈ තුළ...
නැග්ග බව නොදැනුන කල්වාරියත්...
ගවලෙනෙහි හුන් බිළිඳුගේ රුව...
මැවෙයි දැන් මේ මව්ගෙ සිත තුළ...
සුරැකි අන්දම ඔතා රෙදි කඩ...
සිහිනැගෙයි එදින සිසිලසින්...
දිගා කර ඇත කුරුසියක් මත...
අත් පා තද කරන් පුතු නිරුවතින් අද...
වැදුණු පිටි පහර ඇණ මතින් නොව...
සිදුරුවෙයි මේ හදවතත්...
කුරුසියේ ඇණ තුඩින් එල්ලුවෙ ඇගේ ඒ රන් හදවතත්...



# ශුද්ධ වූ සතිය තුළ දෙව්මැදුරේ ප්‍රතිමා (සුරුවම්) ආවරණය කරන්නේ ඇයි?

**මාධව කසුන්ජිත්**
*කාර්මෙල් දේවමාතා දහම් පාසල*
*පල්ලියවත්ත, වත්තල*

අර්ථාන්විතව පාස්කු මහා තුන්දින (Paschal Triduum) සැමරීම සඳහා ශුද්ධ වූ සභා මාතාව සූදානම් වන මෙම කාල සීමාව තුළ දෙව්මැදුර තුළ සිදුවන වෙනස්කම් කිහිපයක් දක්නට ලැබේ. මේ අතරින් සාන්තුවරුන්ගේ සහ කුරුස ප්‍රතිමා දම් පැහැ රෙදිවලින් ආවරණය කිරීම සුවිශේෂී වේ. සභා සම්ප්‍රදාය සහ සභා ඉගැන්වීම් තුළින් පෝෂණය වූ මෙම සම්ප්‍රදාය, ක්‍රිස්තුස් වහන්සේ සිදු කළ උත්තරීතර ප්‍රේමයේ යාගයට ආධ්‍යාත්මිකව ඇතුළු වීමට ප්‍රබල ලෙස ආරාධනා කරයි.

මෙම ප්‍රතිමා ආවරණය කිරීමේ සම්ප්‍රදාය 9 වැනි ශතවර්ෂය දක්වා අතීතයට දිව යන අතර, මධ්‍යතන යුගයේ යුරෝපයේ බහුලව දක්නට ලැබුණි. ජර්මානු භාෂාව කතා කරන ප්‍රදේශවලදී Hungertuch ලෙස හැඳින්වූ මෙම රෙදි කඩ මඟින් මුළු චතාරික කාලය පුරාම අල්තාරය විශාල රෙදිවලින් සම්පූර්ණයෙන්ම ආවරණය කර තබන ලදී. බොහෝ විට මෙම රෙදි කඩ ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් කතාන්දර චිත්‍ර ලෙස එම්බ්‍රොයිඩර් හෝ පින්තාරු කර තිබුණි. මේ මඟින් විශ්වාසිකයන්ගේ අවධානය වෙනතකට යොමු නොකර, ශුද්ධ ලියවිල්ලට, යාච්ඤාවට සහ ගැඹුරු ආධ්‍යාත්මික පරිවර්තනයකට යොමු කරවීම බලාපොරොත්තු විය.

මුල් කාලීනව මෙය සභා සම්ප්‍රදාය තුළ ගොඩනැගුනද, වර්තමානය වන විට ජනවන්දනාව තුළ පිළිපැදෙන සම්ප්‍රදායක් ලෙස සම්මත වී ඇත. මෙම ප්‍රතිමා ආවරණය කර තැබීම වර්තමානයේ චතාරික සමයේ 5 වැනි ඉරුදින සිට ආලේලූයියා සෙනසුරාදා දක්වා සිදු වේ.

ගැලවීමේ කර්තව්‍යයයේ ප්‍රධානතම සලකුණ වූ කුරුසයේ ඇණ ගැසූ ජේසුස් වහන්සේ සිහි ගන්වන එම ප්‍රතිමා සහ සාන්තුවරයන්ගේ ප්‍රතිමා ආවරණය කර තැබීම තුළින්, දෙව්මැදුර තුළ විශ්වාසිකයන්ගේ හදවත තුළ හිස් බවක් ගොඩනැගේ. එනම්, මුල් මහා සිකුරාදා දින ජේසුස් වහන්සේ රෝම සොල්දාදුවන් විසින් අල්ලාගෙන ගිය විට අපෝස්තුළුවරුන් තුළ ඇතිවූ හැඟීම විශ්වාසිකයන් තුළ ගොඩනගමින්, මහා සිකුරාදා දිනට ඔවුන්ව සූදානම් කරයි.

එමෙන්ම මහා බ්‍රහස්පතින්දා දින යාගයෙන් පසු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අල්තාරයෙන් පිටතට වැඩමවීමෙන් අනතුරුව, අල්තාරයේ සියලුම රෙදි ඉවත් කරනු ලබන අතර දිව්‍ය සත්ප්‍රසාද කරඬුවද විවෘතව තැබේ. මේ තුළින් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය ආරම්භ වූ බව සංකේතවත් කරයි. මේ සෑම අංගයක් තුළින්ම බාහිර අලංකරණයන්ගෙන් වෙන් වී, සන්සුන් මනසක් තුළ දේව වාක්‍යය කෙරෙහි වඩා වැඩි අවධානයක් යොමු කිරීමට විශ්වාසිකයන් උනන්දු කරවයි.

මහා සිකුරාදා දින, ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්ති මෙහෙයේදී “මෙන්න කුරුස ගස, ගැලවුම්කරුවාණෝ මෙහි එල්ලී ඇත” යනුවෙන් පවසමින් කුරුස ප්‍රතිමාව නිරාවරණය කරනු ලබන අතර, විශ්වාසිකයින් දණ ගසමින් තම ගෞරවය ඒ වෙත පුද කරති. මේ තුළින් ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසය මත යාග වෙමින් මනුෂ්‍යයා වෙත ගෙනදුන් ගැලවීමේ වටිනාකම තවදුරටත් තීව්‍ර කරමින් ගෙනහැර දක්වයි. මෙම අවස්ථාවේදී විශ්වාසිකයන්ගේ දෙනෙත්, හදවත් සහ මනස යොමු වී තිබෙන්නේ ගැලවීම ගෙනදුන් කුරුසය මත සිටින ජේසුස් වහන්සේ වෙත පමණක් වන අතර, දෙව්මැදුර තුළ ඇති අනෙකුත් ප්‍රතිමා ආවරණය කර ඇති බැවින් ඒ වෙත අවධානය යොමු වීම වැළකේ.

ක්‍රිස්තුස් වහන්සේගේ විජයග්‍රාහී උත්ථානය සමරන පාස්කු පූර්ව රාත්‍රී මෙහෙය (*Easter vigil Mass*) වන විට මෙම ප්‍රතිමා සියල්ලම නිරාවරණය කර තිබේ. ඒ මඟින් ක්‍රිස්තුස් වහන්සේගේ විජයග්‍රාහී මහිමාන්විත තේජශ්‍රීය ද, සාන්තුවරයන්ගේ උසස් බව ද නැවත ප්‍රකාශ වේ.

## තුවාල වුණු දේශයක පාස්කුව

03 පිටුවෙන් >>>

**බියෙන් ධෛර්යයට, නිශ්ශබ්දතාවයෙන් ක්‍රියාවට**

“ඔබට ශාන්තිය වේවා! පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන් මම ද ඔබ යවමි” (යොහන් 20:21)

නැවත නැගිටීම අපට ලෝකයෙන් පලා යාමට ආරාධනා කරන්නේ නැත, නමුත් වෙනස් ආකාරයකින් එයට නැවත ඇතුළු වීමට ආරාධනා කරයි. ගෝලයන් බියෙන්, සංවෘත දොරවල් පිටුපස සිරවී සිටියහ. එහෙත් පාස්කුව ඔවුන්ව වීදිවලට, අවදානම් සහිත ස්ථානවලට, ප්‍රොපේතමය සාක්ෂි දැරීමකට තල්ලු කළේය.

නැවත නැගිටුවනු ලැබූ සභාවකට මධ්‍යස්ථව සිටිය නොහැක. නැවත නැගිටුවනු ලැබූ ජනතාවට නිහඬව සිටිය නොහැක. පාස්කු දිනය අපට අපහසු ප්‍රශ්න අසන්නට අභියෝග කරයි;

දුප්පතුන්ගේ දුක් වේදනා වලින් ප්‍රතිලාභ ලබන්නේ කවුද?

ණය සහ යැපීමෙන් ලාභ ලබන්නේ කවුද?

කතා කරන්නේ කවුද, නිහඬ කරන්නේ කවුද?

නැවත නැගිටීම කෙරෙහි විශ්වාස කිරීම යනු ශ්‍රී ලංකාව - යුක්තිය, අනුකම්පාව, වගවීම සහ වගකීම බෙදාගැනීම මුල් කරගත් ජාතියක් බවට පත් කළ හැකි බව විශ්වාස කිරීමයි.

**නැවත නැගිටීම අද දින ජීවත් කරවීම**

“එබැවින් යමෙක් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටී නම්, එතැන ඇත්තේ නව මැවිල්ලකි” (2 කොරින්ති 5:17)

නැවත නැගිටීම ස්වර්ගයට කල් දමනු නොලැබේ: එය දැන් සහ මෙතැනින් ආරම්භ වේ. සහයෝගීතාවයේ සෑම ක්‍රියාවක්ම, අනෙකා අමානුෂිකව ප්‍රතික්ෂේප කිරීම, සාධාරණත්වය සඳහා වන සෑම අරගලයක්ම, සම්පත් බෙදා ගැනීම සහ බෙදීම් හරහා ඉදිකරන ලද සෑම පාලමක්ම නැවත නැගිටීමේ මොහොතකි.

පාස්කු ඉරිදා අපට ආරාධනා කරන්නේ:

ස්වයං සංරක්ෂණයෙන් බෙදාගත් වගකීම දක්වා,

බියෙන් සදාචාරාත්මක ධෛර්යය දක්වා,

ආගම සැනසිලි දායක දෙයක් ලෙස සිට ඇදහිල්ල යනු කැපවීම දක්වා යොමුවීමටය.

දේව ආශිර්වාද!

# තනි වූ ක්‍රිස්තුන් වහන්සේ

එකල ජේසුස් වහන්සේ ඔවුන් හා සමඟ ගෙත්සෙමන නම් වූ තැනට පැමිණ, "මා මෙතැනට ගොස් යාච්ඥා කරන අතර ඔබ මෙහි සිටින්නැ" යි ශ්‍රාවකයින්ට වදාළ සේක. ඉන්පසු උන්වහන්සේ ශෝක වන්නටත්, සන්තාප වන්නටත් පටන් ගත් සේක. එකල ඔවුන් වහන්සේ ඔවුන් අමතමින් "මැරෙන තරමට මාගේ සිත අතිශයින් ශෝකාන්විතය. ඔබ මෙහි නැවති මා සමඟ අවදිව ඉන්නැ යි වදාළ සේක... ඉන්පසු ඔවුන් වහන්සේ ශ්‍රාවකයන් වෙත අවුත්, "ඔබ තවමත් නිවාඩු ගත්තහු ද ? මෙන්න නියමිත මොහොත ළංව ඇත. "මනුෂ්‍ය පුත්‍රයාණෝ පව්වුන් අතට පාවා දෙනු ලබන සේක. "නැගිටින්න, අපි යමු. අන්න මා පාවා දෙන්නා ඉතා ළඟ යැයි" වදාළ සේක. (ශු. මතෙව් 26:36-38, 45-46)

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මල් උයනේ දී අත්දුටු වේදනාත්මක අත්දැකීම හුදෙක් ශාරීරික, මානසික වේදනාවන් පමණක් නොව, හදවත අභ්‍යන්තරය අත්දුටු මරණීය වේදනාවයි. එපමණට ම පාපයේ විපාකය ද බරපතල ය. ඔවුන් වහන්සේට මෙම මරණීය මොහොතේ දී ඇති වූ බිය, ත්‍රස්තය වේදනාව දෙස අපගේ අවධානය යොමු කරමු. ක්‍රිස්තුන් වහන්සේ මුළු මනුෂ්‍ය සංහතිය වෙනුවෙන් ම පාපය වූ සේක. සමිඳාණන් වහන්සේ පාපය පිළිකුල් කරන සේක. ඒ මන්දයත් ඔවුන් වහන්සේ ශුද්ධය. මෙය ගැඹුරුම අභ්‍යන්තර මරණයකි. අභ්‍යන්තර වේදනාවකි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ජෝර්දාන් ගඟෙහි ශුද්ධාත්මය ස්නාපනය ලැබූ මොහොතේ, ඔවුන් වහන්සේගේ අභ්‍යන්තරයට ඇසුණු හඬ "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි මම ප්‍රසන්න වෙමි." ජේසුස් වහන්සේ සෑම මොහොතකම තම ආදරණීය පියාණන් හා ගැඹුරු සම්බන්ධතාවයක සිටි සේක. නමුත් දැන් සිදුවී ඇත්තේ කුමක්ද? පිය පුත් සබඳතාවය බිඳී ගියා සේය. ගැඹුරු තනිභාවයකි, අසරණභාවයකි. "මා මැරෙන තරම් මාගේ ආත්මය ශෝකාකූලය". මේ මොහොතේ පියාණන් වහන්සේ සමීප ව සිටී නමුත් නොදැනුනාසේය.

**ගරු. කේ. සුමිත් සමීර ප්‍රනාන්දු සහෝදරතුමා**
සිස්ටර්ෂියානු පැවිදි සංඝය.

# චතාරික සමයට අත්වැලක්

කතෝලික අපට අළු බදාදා දිනය විශේෂිත වූ දිනයකි. ඒ මන්දයත් එදිනෙන් අප චතාරික සමයට ඇතුළු වන්නෙමු. පුරාණයේ චතාරික සමයට යෙදූ වචනය වූයේ Lencaten යන්නයි. එහි අර්ථය නම් වසන්ත සමයයි.කිතුනු අපට චතාරික සමය හුදෙක් දුක් කඳුළු වලින් වැලපෙන කාලයකට වඩා අපත් දෙවියන් වහන්සේත් හා සමඟ තිබෙන සම්බන්ධය වැඩිදියුණු කර ගන්නා කාලයකි. එය කතෝලික අපට අධ්‍යාත්මික වසන්ත සමයක් ලෙසද හැඳින්වීමට ද පුළුවන. ලෝකයේ වටිනාකම් තුළම ජීවත් වෙමින් ඒ පසු පස්සේ හතිදාගෙන හැල්මේ දුවනා ජීවිත ගමනට පුංචි විරාමයකි චතාරිකය. මෙම දින 40 පුරාවට වරප්‍රසාදය අත්දැකීමට ශු.සභා මාතාව ඔබට ආරාධනා කරන්නීය.

මෙම ගැඹුරු වරප්‍රසාදය අත් දකිමින් එය අපතේ නොයවා ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා තේජාන්විත උත්ථානය පසක් කරමින් පාස්කු මංගල්‍යය සමරන්නට සූදානම් වන අප ගැඹුරු මනස්ථාපනය වූ හදවතකින් මෙම වරප්‍රසාදික කාලයට ඇතුළු වෙමු. අද හැම දෙයක්ම පාලනය වන්නේ තරඟකාරිත්වයේ නීති මාලාවකට හා බලය මතය. මෙහි ප්‍රතිඵලය ලෙස විශාල වශයෙන් මිනිසුන් කොන් වී සහ නොසලකා හැර දමනු ලැබ ඇත. මේ ක්‍රමය ගැන අවබෝධයකින් තොර වීම නිසා අප දැන් ලගා වී සිටින්නේ අසරණ මිනිසුන්ගේ විලාපයට සංවේදී නොවන, උදව් කිරීමේ අවශ්‍යතාවයක් නොදැනෙන මිනිසුන් ලෙසය.චතාරික කාලයේදී හෝ මේ යතාර්ථය තේරුම් ගැනීමට අප උත්සහ කල යුතුය. යක්ෂයා ලෝකයා මාංශයා පිනවනවාට වඩා වැඩියෙන් දෙවි සමිඳුන්ට ලං වෙමු. ඒ සඳහා දෙවි මහෝත්තමයාණන් වහන්සේගේ බලය නිරන්තරයෙන් පතා අපි යාච්ඤා කරමු.

ඔබ සැමට අධ්‍යාත්මික වසන්ත සමයක් වේවා.

**ප්‍රියන්ති මෙන්ඩිස්,**
සා.ජෝසප් දේවස්ථානය,
පයාගල.



# පාස්කු අභිරහස

මේ පාස්කුවේ මාගේ සිත්හැරීම : පාස්කු අභිරහසක් සමරා අපි දේව අනාවරණයේ අග්‍රස්ථානයට ළඟා වෙමු. එනම් දෙවියන් වහන්සේ ප්‍රේමය වන බව වටහා ගැනීමයි. "ප්‍රේමය" යනු කෙනෙකු විසින් තවත් කෙනෙකුට දෙනු ලබන ආත්ම පරිත්‍යාගයකි. එමඟින් කෙනෙකුගේ ජීවිත පරිත්‍යාගය අදහස් කෙරේ. එබැවින් තම කම නොනසන ආත්ම පරිත්‍යාගයක් තිබිය නොහැකිය.

"යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැත. මා දැන් මාංශයෙහි ජීවත් වන ජීවිතය, මට ප්‍රේම කළ මා උදේසා සිය දිවි දුන්, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි."

අප ස්වාමීන් වහන්සේගේ පාස්කු අභිරහස තුළ සැබෑ ප්‍රේමය යනු කුමක්ද එය ජීවත් කළ යුත්තේ කෙසේද යන්න අපට පැහැදිලි වේ. එමෙන්ම උන්වහන්සේගේ දුක්විඳීම පිළිබඳ අප මෙනෙහි කරන විට මිනිස් අප ප්‍රේම කළ යුත්තේ කෙසේද? දුක් විඳිය යුත්තේ කෙසේද? යන්න මනාව වටහා ගත හැකිය. දුක් විඳීම අන්තරගත නොවන ප්‍රේම කිරීමක් දැකිය නොහැකිය. එම නිසා ක්‍රිස්තුස් වහන්සේ සමඟ අප යාච්ඤාවෙන් බැඳෙන විට උන්වහන්සේ අප වෙනුවෙන් කොතරම් දුක් වින්දේද? අප වෙනුවෙනු කොතරම් ප්‍රේමකර ඇත්ද යන්න පමණක් නොව උන්වහන්සේ මෙන් අප දුක් උසුලා ගන්නේ කෙසේද? ප්‍රේම කරන්නේ කෙසේද? යන්න අපට අවබෝධ වේ. අපගේ ප්‍රේමණීය සාන්තුවරයාණන් වන අසීසියේ ප්‍රැන්සිස් මුනිඳුනට අසාමාන්‍ය ලෙස වරප්‍රසාද ලබා ගැනීමට හැකි වූයේ, ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය පිළිබඳ මෙනෙහි කිරීම තුළ දීර්ඝ යැදුම් දිවියට ඇතුළු වීමෙන් බව අප හා කාටත් මනාව පැහැදිලි වේ. අප සාන්තුවරයාණෝ මෙසේ යාච්ඤා කළහ.

"ජේසුස් ස්වාමීනී, මාගේ මරණයට මත්තෙන් මම ඔබ වහන්සේගෙන් වරප්‍රසාද ද්විත්වයක් ඉල්ලමි. පළමුව, ඔබ වහන්සේගේ දුක් විඳීමේ වේදනාත්මක අත්දැකීම හැකිතාක් දුරට මාගේ ආත්මයට දැනෙන්නට සැලැස්සුව මැනව. දෙවනුව, ස්වකීය කැමැත්තෙන්ම පවුකාර අප වෙනුවෙන් අති මහත් දුක් වේදනා සමුදායක් දරාගන්නට ඔබ වහන්සේට හැකියාව ලබාදුන් අප කෙරෙහි වූ ඔබ වහන්සේගේ ප්‍රේමය හැකිතාක් දුරට මාගේ ආත්මයට දැනෙන්නට සැලැස්සුව මැනව. ආමෙන්."

මේ හා සසඳන කල පාස්කු අභිරහස, එනම් අප ස්වාමීන් වහන්සේගේ දුක් විඳීම මරණය හා උත්ථානය නිරන්තරයෙන්ම අප ජීවිතවල මෙනෙහි කළ යුතු, යාච්ඤාවට භාජනය විය යුතු හා අත්දැකිය යුතු අභිරහසකි.

**මාරි ප්‍රනාන්දු**
ශු.ජපමාල රාජේශ්වරියගේ දේවස්ථානය හේවාදිවෙල



# විමුක්තිය ලැබ දුන් ශුද්ධවූ සතිය

ජුඩ් රවීන්ද්‍ර විනයසිරි
ශා. සෙබස්තියන් දහම් පාසල - මොරගොඩ

කිතුනු අපගේ උතුම් ම මංගලයය වන පාස්කු මංගලයය සිදුකරන්නට අපි මේ දිනවල සූදානම් වෙමින් සිටිමු. ක්‍රි.ව. තුන්වන ශතවර්ෂය වන විට ශුද්ධවූ සභාව තුළ ශුද්ධ වූ සභාව තුළ ශුද්ධ වූ සතිය ඇරඹුණු බව පැවසේ. දුක්බෝත්සව ඉරුදින හෙවත් ගොබ් ඉරුදිනෙන් ශුද්ධවූ සතිය ආරම්භ වේ. ක්‍රිස්තුස් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය සුපරිස්මරණය කරන මේ සතිය අපගේ දේව වන්දනා වසරේ ඇති අති උතුම් සතියයි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ වඩා ප්‍රේමාන්විතව මේ දිනවල අප තුළ ජීවමාන වන සේක.

**ගොබ් ඉරුදින**

තාල අතු හෝ ගොබ් අතු ආසිරි ගන්වා ඒවා රැගෙන පෙරහැරකින් මහත් ජයෝත්සවයෙන් දේවස්ථානයට ඇතුළුවීම මඟින් ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේ ස්වකීය පාස්කු අබිරහස ඉටු කිරීම සඳහා ජෙරුසලම් නුවරට ඇතුළු වීම සාන්ත සභාව උත්සවාකාරයෙන් මෙදින සිහිකරයි.

කිතු සමිඳාණන් අප උදෙසා තමන් වහන්සේව හිස් කර ගනිමින් සේවකයකු ලෙස මරණයට පත්වී උත්ථානය තුළ ජීවිතයක් මිනිස් සංහතියට උදාකර දුන් රජාණන් හා ගැලවුම්කරුවාණන් ලෙස මෙදින අපි උන්වහන්සේ පිළිගනිමු. එදා යුදා ජනතාව පැතූ තමන් බලාපොරොත්තු වූ රෝම පාලනයෙන් නිදහස් කරන දේශපාලනමය කුමාරයෙකු නොව, ගැලවීමත්, විමුක්තියත්, පාපයත්, නිදහස දෙන රජකු දකින්නට සාන්ත සභාව අපට ඇරයුම් කරන්නීය. එම රජකමට දුක්විඳීම හා මරණය පංගුකාරවන හෙයින් සමිඳාණන්ගේ රාජකීයත්වයට උරුමකම් කියන අපිඳු මෙම සතිය තුළදී එම දුක්විඳීමට, මරණයට සහභාගී වන්නට සූදානම් විය යුත්තෙමු.

**තෙලාශිර්වාදිත පූජා මෙහෙය**

ශුද්ධ වූ තෛලය ආශිර්වාද කරනු සඳහා පැවැත්වෙන මේ පොදු පූජා මෙහෙය රදගුරුතුමන් හා පදවියේ පූජක පිරිස අතර ඇති සුහද ඒකත්වය පිළිබිඹු කරන මහඟු අවස්ථාවකි. මෙය පෙරදී මහා බ්‍රහස්පතින්දා පෙරවරුවේදී පැවැත්වූවත් කාලෝචිතව ශුද්ධ වූ සතියේ සඳුදා, අඟහරුවාදා හෝ බදාදා දිනවලින් පහසු දිනයක ඒ ඒ පදවි තුළ පවත්වනු ලබයි. පදවි භාර රදගුරුතුමන් හා ඒ පදවිය තුළ පවත්වනු ලබයි. පදවි භාර රදගුරුතුමන් හා ඒ පදවිය තුළ සේවය කරන පූජක තුමන්ලාගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන මේ දේව මෙහෙයේදී රදගුරුතුමා සිය පූජකතුමනට අනුශාසනා කරමින් සැදැහැවතුන්ට කරන සේවයේදී විශ්වාසපක්ෂ පැවැත්මකට ඔවුන් දිරිගන්වයි. තමන්ගේ පූජක භාර අලුත් කරන්නට මේ අවස්ථාවේදී එතුමෝ සියලු පූජකවරුන් කැඳවති. මෙදින කෙරෙන තවත් වැදගත් කාර්යයක් වනුයේ තෛලය ආශිරවාද කිරීමේ පිළිවෙතයි.

> **කිතු සමිඳාණන් අප උදෙසා තමන් වහන්සේව හිස් කර ගනිමින් සේවකයකු ලෙස මරණයට පත්වී උත්ථානය තුළ ජීවිතයක් මිනිස් සංහතියට උදාකර දුන් රජාණන් හා ගැලවුම්කරුවාණන් ලෙස මෙදින අපි උන්වහන්සේ පිළිගනිමු.**

ශුද්ධවූ ක්‍රිස්මා තෛලය (The sacred chrism oil S.C) මෙය ප්‍රසාද ස්නාපනයේදී, අභිවෘද්ධි ආලේපයේදී හා පූජකවරය සක්‍රමේන්තුව දානය කිරීමේදී භාවිතා කරයි. රෝගීන් සඳහා වූ තෛලය (The oil of the Sick O.C) මෙය රෝගීන්ගේ ආලේපනය දානය කිරීමේදී භාවිතා කරනු ලබයි. ආධුනිකයන් සඳහා වූ පූර්ව ප්‍රසාද ස්නාපන තෛලය (The oil of the Catechuman O.C) ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී භාවිතා කරනු ලබයි. මෙදින ආශිර්වාද කරන ශුද්ධවූ තෛලය වසර පුරා ප්‍රසාද නිධාන දානය කිරීමේදී භාවිතා කරනු ලබයි.

**මහ බ්‍රහස්පතින්දා**

සමිඳාණන්ගේ අන්තිම රාත්‍රී භෝජනය සිහිපත් කරන මෙදින දිව්‍ය සත්ප්‍රසාදය සහ නිල පූජකවර සක්‍රමේන්තුව ස්ථාපිත කිරීමද සිහිපත් කරනු ලබයි. මිනිස් සංහතියට සමිඳාණෝ පෑ උත්තරීතර ප්‍රේමයේ සිහිවටනයක් ලෙස තමන් සිරි සිරුර හා රුහිරය දානය කිරීමත් මා නුඹලාට ප්‍රේම කළාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේම කරන්න යන උතුම් වූ ප්‍රේමයේ පනත දානය කිරීමත් මෙදින සිහිකරන අතර එමඟින් සහෝදර දයාව, සේවය, උන්වහන්සේගේ සේවකභාවය, ප්‍රකාශ කෙරෙන පාද දෝවනය ගැන ද සාන්ත සභාව අනාවරණය කරමින් දේව වන්දනාවට යොමු කරනු ලබයි. සාමාන්‍යයෙන් මේ මෙහෙය හිරු බැස ගිය පසුව පැවැත්වේ.

මෙදින දිව්‍ය යාගයේදී සුරදූත ගීය එනම් ස්වර්ගයේ දෙවියන් වහන්සේට යන්න ගායනා කරන අතර සීනුව නාද කරනු ලැබේ. එයින් පසු පාස්කු පූර්ව යාත්‍රී මෙහෙයේදී නැවත සීනුව නාද කරන තෙක් සීනුව නාද කරනු නොලැබේ.

සාමාන්‍යෙයන් පාද දෝවනය කරනු ලබන්නේ දේශනාවෙන් පසුවය. මේ අවස්ථාවේ දී පිළිවෙතේ දී ඇති හෝ අවස්ථාවට උචිත වෙනත් ගීතිකා ගායනා කළ හැකිය.

දිව්‍ය පූජාවෙන් පසුව සත්ප්‍රසාද නිවහනෙහි දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තබනු නොලැබේ. අල්තාර රෙද ඉවත්කර සත්ප්‍රසාද නිවහන නිරාවරණයකොට තබයි. මහ සිකුරාදා දේව මෙහෙයේදී දානය කරනු ලබන දිව්‍ය සත්ප්‍රසාදය පෙරහැරකින් වැඩමවාගෙන සකසා ඇති මණ්ඩපය වෙත ගෙනයනු ලැබේ. මේ අවස්ථාවේදී ජය හඬින් සිරි දේහේ යන ගීය හෝ වෙනත් උචිත ගීතිකාවක් ගායනා කරනු ලැබේ.සත්ප්‍රසාද වහන්සේ මණ්ඩපයේ වැඩම

19 පිටුවට >>>

## විමුක්තිය ලැබ දුන්...

18 පිටුවෙන් >>>

කරන දුම් පූජා ආ උතුම් මේ අභිරහස යන ගායනා කර යැදුම් මෙහෙය ආරම්භ කරයි. මේ යැදුම් මූලික වන්නේ ජීවමානව වැඩ සිටින දිව්‍ය සත්ප්‍රසාදයේ සමිඳාණන් වන්දනා කිරීමට වඩා එදා අන්තිම රාත්‍රී භෝජනයෙන් පසුව පේදුරු, ජුවාම්, ජාකොබ්, සමඟ ගෙත්සෙමනියට ගිය ස්වාමීන් වහන්සේගේ බියකරු ශෝකජනක අත්දැකීම සමඟ ඒකාත්මික වෙමින් මැදියම් රාත්‍රිය දක්වා යැදුම් කිරීමයි.

### මහ සිකුරාදා

මෙදින සවස තුනට පමණ සමිඳාණන්ගේ දුක්ඛෝත්සවය පවත්වනු ලැබේ. මෙදින මෙහෙය

1. දේව වාක්‍ය යේ මෙහෙය
2. ශ්‍රී කුරුස වන්දනා මෙහෙය
3. දිව්‍ය සත්ප්‍රසාදය දානය කිරීමේ මෙහෙය

යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ. කුරුසයෙන් වූ මහා ගැලවීමේ අභිරහස කෙරෙහි ගැඹුරු ලෙස මෙනෙහි කිරීමකට යොමු කරන මහා සිකුරාදා අතීතයේදී දුක්ඛර දිනයක් ලෙස සැලකුවත් මහත් ජයග්‍රාහී දිනයක් ලෙස අද අපට සාන්ත සභාව ඉදිරිපත් කරන්නීය.

ජේසු සමිඳාණන් ගේ කුරුසියේ මරණය ගැන කණගාටු වුවත් කුරුසියෙන් ලොවට ගෙනදුන් ගුණාත්මක අර්ථයත්, එහි අභ්‍යන්තර බලයත් ගැන මොහොතකට හෝ සිතන්නට සාන්ත සභාව මතක් කර දෙන්නීය. එනම් කුරුසිය තුළින් මිනිස් සංහතිය ලැබූ විමුක්තියත්, ගැලවීමත් සිහිපත් කිරීමට ඇරයුම් කරන්නීය.

අප වෙනුවෙන් ජීවිතය පූජා කළ ක්‍රිස්තුස් වහන්සේට කැපවීමේ සළකුණක් ලෙස පියතුමා ආරම්භයේදීම අල්තාරය ඉදිරිපිටට පැමිණ ආචාර කොට මුනින්තලා වැටෙන අතර සියල්ලෝම දණ ගසාගෙන ඉතා සුළු වේලාවක් නිශ්ශබ්දව යාච්ඤා කරති.

**අප වෙනුවෙන් ජීවිතය පූජා කළ ක්‍රිස්තුස් වහන්සේට කැපවීමේ සළකුණක් ලෙස පියතුමා ආරම්භයේදීම අල්තාරේ ඉදිරිපිටට පැමිණ ආචාර කොට මුනින්තලා වැටෙන අතර සියල්ලෝම දණ ගසාගෙන ඉතා සුළු වේලාවක් නිශ්ශබ්දව යාච්ඤා කරති.**

පොදු යැදුමින් පසු දේව වාක්‍ය මෙහෙය ඇරඹේ. මෙහිදී දෙවියන් වහන්සේගේ පොරොන්දුව හා ගැලවීමේ සැලැස්ම තුළ මෙසියස් වන දෙවියන් වහන්සේගේ දුක් විඳින සේවකයාට ලබා දුන්නේ ජයග්‍රහණයේ මේ දේව පුත්‍රයා තුළ පැහැදිලි කරයි. දේශනාවෙන් පසුව විශ්වාසිකයින්ගේ යාච්ඤා ආරම්භ කෙරේ. පූජාප්‍රසාදි තුමා සුදසුන ළඟ හෝ දේව වාක්‍යයේ පීඨය අසළ හෝ සිය දෙඅත් වැඳගෙන යාච්ඤාවේ අරමුණ ආරම්භ පාඨය කියවයි. ඉන්පසුව සුළු මොහොතක් සියල්ලෝම නිශ්ශබ්දව යාච්ඤාවේ යෙදෙති. ඉන්පසු පූජාප්‍රසාදීතුමා දෙඅත් විහිදා යාච්ඤාව කියයි. යාච්ඤාව මෙහෙය පුරාම විශ්වාසිකයන්ට දණ ගැසීමට හෝ නැගිට සිටීමට හෝ හැකිය.

ශුද්ධ වූ සභාව උදෙසා, ශුද්ධෝත්තම පියාණන් උදෙසා, ශුද්ධ වූ සභාවේ ගිහි පැවිදි සියල්ලන් උදෙසා, ධර්මාපේක්ෂකයන් උදෙසා, සභා සමගිය උදෙසා, යුදා ජාතිකයින් උදෙසා, ක්‍රිස්තුස් වහන්සේ තවමත් නොහඳුනන අය උදෙසා, දෙවියන් වහන්සේ නොඅදහන අය උදෙසා, රාජ්‍ය පාලකයන් උදෙසා හා නොයෙක් උවදුරින් පෙළෙන්නන් උදෙසා යාච්ඥා කිරීම විශේෂත්වයයි.

### ශ්‍රී කුරුසියේ වන්දනා මෙහෙය

කුරුසිය දුක, වේදනාව, සංකේතවත් කරයි. එය වරදෙහි ඔප්පු සාපයකි. ඒ සකල මිනිස් සංහතියේම ජයකුන්තය ලෙස කුරුසිය ඉදිරිපත් කරන සාන්ත සභාව ජේසු සමිඳුන්ගේ බැහැපත්කම, කීකරුකම තුළ සමාවේ හා කරුණාවේ මහා ජය ටැඹ කුරුසියම වන බව අනාවරණය කරන්නීය. මේ නිසා කුරුසිය වන්දනා කිරීම මෙදින දේව වන්දනාවේ වැදගත් අවස්ථාවක් වන්නේය. කුරුසිය වැඩමවන ආකාර දෙකකි. ඉන් එක් ක්‍රමයක් මෙලෙස සඳහන් වේ.

පූජාප්‍රසාදීතුමා හෝ තේවාචාරිවරයකු හෝ සහායකයන් සමග දේවස්ථානයේ ප්‍රධාන දොරටුව වෙත යයි. එහිදී රෙදි කඩකින් වසා ඇති කුරුසිය අතට ගෙන දැල්වෙන ඉටිපහනක් ගත් සහායකයන් දෙපසින් ඇතිව දෙව්මැදුර මැදින් ශුද්ධ මණ්ඩපය කරා පැමිණෙයි. මහා දොර ළඟදී, දෙව්මැදුර මැදදී ද, ශුද්ධ මණ්ඩපයට ඇතුළු වන තැනදී ද නැවත කුරුසිය ඔසොවා කුරුසියේ ගස මේ බලව් යන්න ගයමින් සැදැහැවතුන් වන්දනාවට කැඳවති. සැදැහැවත්හු ක්‍රිස්තුනී ඔබට නමස්කාර කර... යන්න ගයමින් පිළිතුරු දී දණ ගසා සුළු මොහොතක් නිශ්ශබ්දව වන්දනා කරති.

මෙය තෙවරක් කරනු ලැබේ. ඉන්පසු ශුද්ධ මණ්ඩපයට ඇතුළුවන තැන කුරුසිය තබා දැල්වෙන ඉටිපහන් දෙක ද දෙපස තබයි. ඉන්පසු පූජාප්‍රසාදීතුමා කුරුසිය සිපාචාර කරයි.

### දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීමේ මෙහෙය

දිව්‍ය සත්ප්‍රසාද මෙහෙය සඳහා පූජාසනය මත සුදු ඇතිරිල්ලක් දමා ශුද්ධවූ ලේන්සුව හා පොත් තබනු ලැබේ. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කිරීමෙන් පසු පූජාප්‍රසාදි තුමා පූජාසනය වෙත පැමිණ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ගරු කොට ස්වර්ගයේ වැඩසිටින යාච්ඤාව උච්ඡාරණය කිරීමට ජනතාවට ආරාධනා කරයි. අනතුරුව පෙරදින තැන්පත් කළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මෙදින දානය කරනු ලැබේ. මහා බ්‍රහස්පතින්දා උන්වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රී ශරීරය හා රුධිරය පූපය තුළ සංකේතවත් කරමින් අප උදෙසා උන්වහන්සේ ගේ ජීවිතය පූජා කළ සේක. රුධිරය වගුරුවාලූ සේක. එමගින් එදින දිව්‍ය භෝජනය තුළ උන්වහන්සේ සංකේතාත්මක මරණය පෙන්වාලූ සේක. ඒ මරණය පසු දින එනම් මහ සිකුරාදා කුරුසිය මත තම ප්‍රාණය පූජා කරමින් තහවුරු කළ සේක. මහා සිකුරාදා තමන් පවරා දුන් ඒ ප්‍රේමයේ ජීවිතයෙන් අප හැම පෝෂණය කරන ජේසු සමිඳාණෝ ඒ ශක්තිය තුළ අප එකිනෙකාගේ ආත්මාර්ථයට මැරෙන්නට ද ඒ මරණය තුළ උත්ථානයක් අත්දකින්නටද ඇරියුම් කරන සේක. ස්වාමීන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය හා මරණය ගැන භාවනා කරමින් ගයන පසම් හා ලතෝනි ගායනා කරනු ලැබේ. මෙදින ගොඩ මස් වැළකීමේ හා එක්වරු ශීලය රැකීමේ දිනයකි. ගොඩ මස් වැළකීම අවුරුදු හත ඉක්මවූ හැමට ද එක්වරු ශීලය අවුරුදු දහ අටත්, හැටත් අතර වූ රෝගී හා ගර්භනී අය හැර අන් සැමටද නියම වේ.

### ආලේලූයියා සෙනසුරාදා

මෙදින ශුද්ධ වූ සභා තොමෝ සමිඳුන්ගේ සොහොන ළඟ සිටින්නීය. උන්වහන්සේගේ මරණය හා දුක්ප්‍රාප්තිය ගැනද භාවනා කරමින් සමිඳාණන්ගේ විජයග්‍රාහී උත්ථානයට සූදානම් වීමට ශුද්ධවූ සභා මාතාව සිය සැදැහැවතුන් සූදානම් කරනු ලබයි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කරනු ලබන්නේ මරණාසන්න වූවන්ට පමණකි. මෙදින රාත්‍රියේදීම පැවැත්වෙන ස්වාමීන් වහන්සේගේ උත්ථානය සමරන පාස්කු පූර්ව රාත්‍රී මෙහෙයේදී ප්‍රීතිජනක වූ උත්ථාන සමය ආරම්භ වන්නේය.

### පාස්කු පූර්ව රාත්‍රී මෙහෙය

පාස්කු පූර්ව රාත්‍රී මෙහෙය කොටස් හතරකින් සෑදී ඇත.

**පළමු කොටස** - ආලෝකයේ මෙහෙය

අලුත් ගින්දර අවුළුවා පාස්කු ඉටිපහන දල්වනු ලැබේ. පාස්කු ඉටි පහන උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ සංකේතවත් කරයි. පාස්කු ඉටි

20 පිටුවට >>>

## විමුක්තිය ලැබ දුන්... 19 පිටුවෙන් >>>

පහන උත්ථාන සමය තුළ දේවස්ථානයේ දල්වනු ලැබේ. මේ පහන ප්‍රසාද ස්නාපන පිළිවෙතේ දී ද දල්වමින් අප ක්‍රිස්තු සමිඳුන්ගේ උත්ථානයට ප්‍රසාද ස්නාපනීය සක්‍රමේන්තුව තුළ සහභාගී වන අතර අවමංගල්‍යය පිළිවෙතේදී ද පාස්කු ඉටි පහන දල්වමින් කිතු සමිඳුන්ගේ උත්ථානය තුළ නව ජීවනයක් ලැබීමේ බලාපොරොත්තුව ඇති කරගන්නා බව ද සංකේවත් කරයි.

පාස්කු ඉටි පහන ද පිරිසිදු මී ඉටි වලින් තනනු ලැබේ. ඒ ඉටි පහනේ ක්‍රිස්තුස් වහන්සේ ඊයෙත්, අදත්, ආරම්භය හා අවසානය වන බව පවසමින් කුරුසිය සලකුණ අඳිනු ලබයි.

උන්වහන්සේ ආරම්භයත් අවසානයත් වන බව දක්වමින් 'අල්ෆා' හා 'ඔමෙගා' යන ග්‍රීක භාෂාවේ මුල හා අග අක්ෂර සලකුණු කරයි.

උන්වහන්සේට කාලයත්, යුගයත්, අනන්ත කාලයත්, අයිති බව ද හැම යුගයෙහිම මහිමය හා ආධිපත්‍යයත් වේවා යයි ද පවසමින් කුරුසියේ හරස් කඩෙන් සෑදෙන කොන් සතරේ 2026 ද සලකුණු කරයි.

සලකුණු කරන ලද කුරුසේ සුවඳ ලාටු වලින් සෑදූ ඇණ පහක් සවි කරමින් ස්වාමීන් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රභාවත් සිරි වණ කැළැල් මගින් අප කෙරෙහි දැක්වූ ආරක්ෂාව හා සුරැකියාව පෙන්නුම් කරයි.

අපගේ ආලෝකය ක්‍රිස්තුස් වහන්සේ යැයි තුන්වරක් ගායනා කරමින් අඳුරේ ඇති දේවස්ථානය වෙතට දල්වන ලද ඉටිපහන ගෙන පාස්කු ජයමංගල්‍යයේ ගීය මහත් ගාම්භීරව ගායනා කරනු ලැබේ. සියලු දෙනා දල්වන ලද ඉටිපහන් රැගෙන ඒ ගාම්භීර ප්‍රකාශනයට තමන්ද හවුල්වන බව පෙන්නුම් කරති. පාස්කු ඉටිපහන ගාම්භීරව දේවස්ථානයට ගෙන නියමිත තැන ස්ථාපනය කරයි.

**දෙවන කොටස** - දේව වාක්‍යයේ මෙහෙය

සභාවේ රාත්‍රී මෙහෙය අතර මුල් තැන ගන්නාවූ මේ රාත්‍රී මෙහෙයේ සාම්ප්‍රදායිකව දේව වාක්‍යය පාඨ නමයක් එනම්, පැරණි ගිවිසුමෙන් පාඨ හත හා නව ගිවිසුමෙන් සංදේශය හා සුවිශේෂය කියවනු ලැබේ. සාන්ත සභාව සමිඳාණන් වහන්සේ ආරම්භයේ සිටම සිය සෙනග සඳහා සිදුකළ මහත් ආශ්චර්යයමය සිදුවීම් දේව ප්‍රකාශනය තුළ මෙනෙහි කරමින් උන්වහන්සේ අපට දුන් පොරොන්දු අරඹයා විශ්වාසය හා බලාපොරොත්තුව තිරසාර කරගන්නට මග පෙන්වන්නීය.

පැරණි ගිවිසුමේ පාඨ කියවා පිළිතුරු ගීය ගායනා කළ පසු පූජාසනයේ ඉටි පහන් දල්වා මහත් ගාම්භීරව සුරදූත ගීය හෙවත් ග්ලෝරියා ගායනා කෙරේ. දේවස්ථානයේ සීනුව නාද කෙරේ.

> **ප්‍රසාද ස්නාපන අපේක්ෂකයන් තමන්ගේ එකම ස්වාමියා ගැලවුම්කරුවාණන් හා පරිශුද්ධ කරන්නා ලෙස පිතා, පුත්‍රයා, ස්ප්‍රීතු සාන්තු වහන්සේලා පිළිගන්නා අතර යක්ෂයා ද, පාපය ද ප්‍රතික්ෂේප කරමින් තම විශ්වාසය එඩිතරව ඉටිපහන් දල්වා ප්‍රකාශ කරති.**

ඉන්පසු පොදු යැදුම ද සංදේශය ද ප්‍රකාශ කර මහත් ගාම්භීරව ආලේලූයියා ගායනා කරනු ලැබේ. සැදැවතුන් ද ඒ ජය ගොසට හවුල් වෙමින් ආලේලූයියා ගායනා කරති. එයින් පසුව සුවිශේෂය ප්‍රකාශ කරනු ලැබේ.

**තෙවන කොටස** - ප්‍රසාද ස්නාපන මෙහෙය

පාස්කු ඉරුදින උදාවත්ම නවකයනට ප්‍රසාද ස්නාපනයේ නව උපත දීමේ අදහසින් මේ මෙහෙය පවත්වනු ලැබේ.

පළමුව කෙරෙනුයේ ප්‍රසාද ස්නාපන අපේක්ෂකයන් කැඳවීමයි. ඉන්පසුව සියලු සාන්තුවරුන්ගේ ප්‍රාර්ථනාව කියනු ලැබේ. ප්‍රසාද ස්නාපන අපේක්ෂකයන් නොසිටින විට සහ ප්‍රසාද ස්නාපන ජලය ආසිරි ගැන්වීම නොකරන විට සියලු් සාන්තුවර ප්‍රාර්ථනාව ගායනා නොකෙරේ. එහෙත් ප්‍රසාද ස්නාපන අපේක්ෂකයන් නොසිටියත් ප්‍රසාද ස්නාපන ජලය ආසිරි ගන්වන විට සියලු සාන්තුවර ප්‍රාර්ථනාව ගායනා කරනු ඇත.

ප්‍රසාද ස්නාපන අපේක්ෂකයන් තමන්ගේ එකම ස්වාමියා ගැලවුම්කරුවාණන් හා පරිශුද්ධ කරන්නා ලෙස පිතා, පුත්‍රයා, ස්ප්‍රීතු සාන්තු වහන්සේලා පිළිගන්නා අතර යක්ෂයා ද, පාපය ද ප්‍රතික්ෂේප කරමින් තම විශ්වාසය එඩිතරව ඉටිපහන් දල්වා ප්‍රකාශ කරති.

වැඩිහිටි නවකයෝ සිටිත්නම් විශ්වාසය ප්‍රකාශ කරනු ලබන්නට ඔවුනට ප්‍රසාද ස්නාපන හා අභිවෘද්ධි ආලේපය දානය කරනු ලැබේ. අනතුරුව සියලු සැදැහැවතුන් ඉටිපහන් දල්වා තම ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කරති. පසුව පියතුමා ආසිරි ගැන්වූ ප්‍රසාද ස්නාපන ජලයෙන් සියලු විශ්වාසකයින්ව ආසිරි ගන්වන්නෝය.

**සතරවන කොටස** - ස්තෝත්‍ර යාගික මෙහෙය

ශුද්ධ වූ සභාව සමිඳාණන්ගේ මරණය හා උත්ථානය මගින් සිය සෙනඟ සූදානම් කළ මංගල භෝජනය කරා මේ මෙහෙය තුළ ජනතාව කැඳවන්නීය. පඬුරු පෙරහැරෙන් මේ කොටස ඇරඹෙයි. මෙහෙය අවසානයේදී ජනතාවට ආචාර කරන පූජාප්‍රසාදි තුමා යන්න සාමය ගෙන යන්න, ආලේලූයියා ආලේලූයියා කියූ පසු ජනතාවද දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා ආලේලූයියා, ආලේලූයියා යයි කියමින් ආචාර කරති.

### පාස්කු ඉරුදින

මරණය පැරදූ ජේසු සමිඳාණන් මුළු ලොව මරණින් ගැළවීමේ මහා අභිරහස මෙදින මහත් උත්සවාකාරයෙන් සමරන්නෙමු. දුක, වේදනාව, අසහනය, හා අසාධාරණය තුළ මිනිසා තැලූ පෙලූ පාපය වහල් බවින් ඔවුන්ව එතෙර කිරීමට ජේසු සමිඳාණන් තම කුරුසේ විජයග්‍රාහී ගමන අපට හෙළි කළේ සත්‍යය, අසත්‍යයට වඩා බලවත් බවත්, යහපත අයහපත අභිබවා යන බවත්, ප්‍රේමය, වෛර කිරීමට වඩා උත්කෘෂ්ඨ වන ජීවිතය මරණය පිටුදකින අයුරුය.

අපගේ ප්‍රසාද ස්නාපන ජීවිතය තුළ මේ උත්ථානයේ පාස්කු අභිරහසට අපව ද ඇතුළු කරන සාන්ත සභා මාතාව සෑම දිනකම පාස්කුවත්, එනම් ප්‍රසාද ස්නාපනීය ජීවිතයක් අත්දැකිය යුතු බවත් ඒ තුළ අසත්‍යය, අයහපත හා වෛරය මරණය පරදා සත්‍යයේ යහපතේ ප්‍රේමයේ නව ජීවිතයක් ලබා ගන්නට උනන්දු කරවයි.

මේ නිසා මුලින්ම කී පරිදි පාස්කුව දේව වන්දනා වසරේ ප්‍රධානතම මංගල්‍යය පමණක් නොව කිතුනු ඇදහිල්ලේ කේන්ද්‍රයයි. ඒ නිසා අපගේ ජීවිතයේ සෑම සිතිවිල්ලක්ම වචනයක් සහ ක්‍රියාවක් කේන්ද්‍රගත විය යුත්තේ පාස්කුව මුල් කරගෙනය. එනම් ආත්මාර්ථය නැති පරාර්ථයට නව ජීවනයක් ලැබීමටය.

**කුරුසියක් නොම වී**
**මිදීමක් වූ එතුමා**

**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි**

සංස්කරණය
**කේ.ඒ.එල්.එස්. කැලෑපිටිය**
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

පරිගණක පිටු නිර්මාණය
**බී.බී.ඩී.එම්. ප්‍රියදර්ශන**
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

පාස්කු වෙනුවෙන් නිකුත් කළ මෙම සඟරාව සඳහා භාවිතා කර ඇති සමහර පින්තූර අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වේ. ඒවායේ අයිතිය අදාළ හිමිකරුවන්ට අයත් වේ. මෙම සඟරාව වාණිජ අරමුණක් සඳහා භාවිතා නොකරයි.